# පොල් සංවර්ධන අධිකාරිය

COCONUT DEVELOPMENT AUTHORITY
SRI LANKA

## වාර්ෂික වාර්තාව

## 2014

# පොල් සංවර්ධන අධිකාරිය

## අපගේ දර්ශනය

"පොල් කර්මාන්තය දළ දේශීය
නිෂ්පාදනය සඳහා
වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම
දයකත්වය ලබා දෙන්නා වීම සහ
නිෂ්පාදන අලෙවි විවිධාංගීකරණයේදී
ගෝලීය නායකයා වීම."

## අපගේ මෙහෙවර

ගෘහස්ත පරිභෝජනය සහ කර්මාන්තය සඳහා
පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම තහවුරු
කිරීම මඟින්,
පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජ්‍යමය
ඵලදායිතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය
සඳහා ඉහළ දයකත්වයක් කරා
ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම.

# හැඳින්වීම

සමස්ත පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතෙහි " පොල් සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ(මෙහි මින්මතු " අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන )අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුය " යන 111 වන කොටසේ 24 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ප්‍රධානතම ව්‍යවස්ථාපිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වේ.

පොල් සංවර්ධන අධිකාරියේ කර්තව්‍යයන් පනතේ 30(1) වගන්තිය අනුව පහත පරිදිවේ.

(අ) පොල් කර්මාන්තය සහ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ආර්ථික වශයෙන් ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙන් සංවර්ධන ප්‍රමුඛතා පිළිබඳව තීරණය කිරීම හා ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත සහය ලබා දීම.

(ආ) එසේ තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා වලට අනුකූලව ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සකස් කිරීම හෝ සකස් කිරීම සඳහා සහය වීම.

(ඇ) එසේ සකස් කරනු ලබන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා සහය ලබා දීම.

(ඇ) මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් පිහිටුවා ඇති මණ්ඩලවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඉ) මණ්ඩලවල වාර්ෂික අය වැය අනුමත කිරීම හා ඔවුන් වෙත අරමුදල් ලබා දීම.

(ඊ) නිසි කළමණාකරණ ගිණුම්කරණ පද්ධති සකස් කිරීම ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා මණ්ඩල වෙත උපදෙස් ලබා දීම හා සහය ලබා දීම.

(උ) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මණ්ඩලවල ප්‍රගතිය ඇගයීම.

(ඌ) පොල් කර්මාන්තය හෝ එහි නිෂ්පාදන පිළිබඳ යම් අංශයක් හෝ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ සිදු කරනු ලබන යම් තැනැත්තෙකුට හෝ පුද්ගල මණ්ඩලයකට (සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ ) මූල්‍ය සහ වෙනත් යම් ආකාරයක සහය ලබා දීම හා එවැනි පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

(එ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සමාන හිමිකම් හා කර්තව්‍ය ඉටු කරනු ලබන ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීතාවන්ට එළඹීම.

(ඒ) පොල් කර්මාන්තය කෙරෙහි බලපාන හෝ අදාල සියළු කාරණා පිළිබඳව අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම.

(ඹ) පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම හා යළි පණ ගැන්වීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියේ මතය වන යම් සියළු පියවර ගැනීම.

අධිකාරියේ බලතල පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව පහත පරිදිවේ.

31 (1) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උචිත හෝ අනුශාංගික වන්නා වූ යම් සියළු ක්‍රියා සිදු කිරීමට වහා පියවර ගැනීමට අධිකාරියට බලතල තිබිය යුතුය.

(2) (1) වන උප වගන්තිය මඟින් පවරා ඇති බලතල ව්‍යාපෘතියට අගතියක් නොමැතිව 22 (2) වන වගන්තිය මඟින් විධිවිධාන සලස්වා ඇති සියළු බලතල මණ්ඩලය හා සමානව අධිකාරිය වෙත තිබිය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් යෝග්‍ය යැයි සලකනු ලබන විට ඔහු විසින් ගැසට් පත්‍රයේ කරනු ලබන නියමයක් මඟින් 23 වන වගන්තිය මඟින් විධි විධාන සලස්වා ඇති විශේෂ බලතල වලින් එකක් හෝ කිහිපයක් හෝ ඉන් යම් කොටසක් මණ්ඩලය හා සමාන ආකාරයෙන් අධිකාරිය වෙත පවරනු ලැබිය හැකිය.

පොල් කර්මාන්ත ක්ෂේත්‍ර යෙන් ශ්‍රී ලංකාව 2014 වසරේදී රුපියල් බිලියන 72 කට ආසන්න විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ඇති අතර, පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වලින් දළ දේශීය නිෂ්පාදනයට වාර්ෂිකව විශාල දායකත්වයක් ලබා දේ.

අමාත්‍යාංශය විසින් පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති හඳුනාගෙන සකස් කිරීමේදී ඒ සඳහා සහාය දැක්වීමේ කාර්යයන් ඉටු කිරීමට අමතරව පොල් කර්මාන්තයේ පිරිසැකසුම් සහ අලෙවිකරණ අංශයන් සංවර්ධනය කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී මෙහෙයුම් කාර්යභාරය ක්‍රියාත්මක කිරීම උදෙසා කාර්යමය වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, මුදල් අංශය සහ පාලන යනුවෙන් ක්‍රියාකාරී අංශ 5 කින් සමන්විත වන අතර එක් එක් අංශය භාරව අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරයි. මෙම කාර්යයන් ඉටුකරගැනීමේදී ඉංජිනේරු අංශය සහ අභ්‍යන්තර විගණන අංශය ඉහත අංශවලට සහාය වේ.

සභාපති ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කරන අතර අධිකාරියේ වැඩකටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා හරහා සැකසුම් සංවර්ධන අංශය,තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය ,අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය,පාලන අංශය හා මුදල් අංශයයේ අධ්‍යක්ෂකවරුන් හරහා ඉටුකරනු ලබයි. මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 258 කි.2014 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 178 වූ අතර එම සේවක සංඛ්‍යාව 27 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ.

## සභාපතිතුමාගේ සමාලෝචනය - 2014

දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ පොල් ගස භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 394,836 ක් පුරා විහිදී පවතී. ඉන් 56%ක් පමණ කුරුණෑගල, පුත්තලම, හා ගම්පහ යන පොල් ත්‍රිකෝණයට අයත් දිස්ත්‍රික්ක වල ව්‍යාප්තව පවතින අතර, පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වැඩි ප්‍රමාණයක් ද ඒ ආශ්‍රිතව කේන්ද්‍ර ගත වී ඇත. පොල්, මිනිසාගේ සමාජ ආර්ථිකය කෙරෙහි විශාල බැඳියාවක් ඇති අතර, පොල් ගසේ නිෂ්පාදන විවිධ කාර්යයන් සඳහා යොදා ගනී. ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් ඵලදාව ගෙඩි මිලියන 2500 – 2900 අතර අගයක පවතින අතර, ඉන් 65%ක් පමණ වැය වන්නේ දේශීය ගෙඩි පොල් පරිභෝජනය සඳහාය. තවත් 15%-20% අතර ප්‍රමාණයක් දේශීය පොල් තෙල් කර්මාන්තය සඳහා යෙදවෙන අතර , ඉතිරිය පොල් මද ආශ්‍රිත අපනයන කර්මාන්තය (දිසිදි පොල්, කොප්පරා, පොල් කිරි, පොල් කිරි පිටි, පොල් ක්‍රීම් හා ගෙඩි පොල් අපනයනය) සඳහා බෙදී යයි.

පොල් කර්මාන්ත ක්ෂේත්‍ර යෙන් ශ්‍රී ලංකාව 2014 වසරේදී රුපියල් බිලියන 73 කට ආසන්න විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ඇති අතර, පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වලින් දල දේශීය නිෂ්පාදනයට වාර්ෂිකව 1.1% කට ආසන්න අගයක් එකතු වේ. එමෙන්ම, පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වල නියුතු සෘජු හා වක්‍ර රැකියාලාභීන්ගේ සංඛ්‍යාව අති විශාලය.

පොල්, ජනතාවගේ දෛනික ආහාර වේලෙහි ප්‍රමුඛතාවයක් ගන්නා අතර, පොල් පරිභෝජනයෙන් ජනතාවගේ ආහාරයට අවශ්‍ය කැලරි ප්‍රමාණයෙන් 15%ක් ද, ප්‍රෝටීන් ප්‍රමාණයෙන් 5%ක් හා මේද ප්‍රමාණයෙන් 70% ක් පමණ ලබා ගනී. මේ වන විට පොල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ 150 කට ආසන්න ප්‍රමාණයක් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන අතර , ඉන් ප්‍රධාන භාණ්ඩ 35 කට ආසන්න සංඛ්‍යාවක් වාර්ෂිකව ලොව පුරා පිහිටි රටවල් 125 කට පමණ අපනයනය කෙරේ.

2010 වසරේදී පොල් වගාවේ හා පොල් කර්මාන්තයේ උන්නතිය උදෙසා අතිගරු ජනාධිපතිතුමන් විසින් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය නමින් වෙනම කැබිනට් අමාත්‍යාංශයක් පිහිටවූ අතර, ඒ තුලින් පොල් කර්මාන්තය නව මාවතකට රැගෙන යාම සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ගරු. ජගත් පුෂ්පකුමාර මැතිතුමා නිරතුරුවම කටයුතු කල අතර ඒ සඳහා පොල් සංවර්ධන අධිකාරිය මෙහෙයවන ලදී.

2014 වසරේ ශ්‍රී ලංකාවේ පොල් ඵලදාව ගෙඩි මිලියන 2870 ක අගයක් ගත් අතර, එවැනි තත්වයක් තුල පවා පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත නිසි පරිදි පවත්වා ගෙන යමින් 2013 වසරට සාපේක්ෂව 2014 වසරේ පොල් කර්මාන්තයේ අපනයන ආදායම රුපියල් බිලියන 72.87 දක්වා 52% කින් වර්ධනය කිරීමට හැකි වීම පොල් කර්මාන්ත ක්ෂේත්‍රය ලැබූ සුවිශේෂ ජයග්‍රහණයකි.

ගෘහස්ථ පරිභෝජනයේදී සිදුවන පොල් නාස්තිය අවම කිරීමෙන් ඒ තුලින් ඉතිරිවන ගෙඩි පොල් දිසිදී පොල් කර්මාන්තය ඇතුළු පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා යොදා ගැනීමටද, දැනට භාවිතයට නොගෙන අපතේ යන පොල් කටු හා පොල් ලෙලි ක්‍රමවත් පරිදි එක්රැස් කර ඒවා අදාල කර්මාන්ත සඳහා නිසි පරිදි යොමු කිරීමටද දීප ව්‍යාප්ත වැඩ පිළිවෙලක් පොල් සංවර්ධන අධිකාරිය මේ වන විටත් ආරම්භ කර ඇත. එමෙන්ම, පොල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමේදී අපගේ නිෂ්පාදන වල අනන්‍යතාවය සුරකෙන පරිදි සන්නාම නාම භාවිතා කරමින් ඉදිරි අපනයන කටයුතු සිදු කිරීම සඳහාද මේ වන විට අවශ්‍ය මූලික කටයුතු සූදානම් කරමින් පවති. ඒ තුලින් විදේශ වෙළඳපල සඳහා තත්වයෙන් වඩාත් උසස් පොල් නිෂ්පාදන අපනයනය කිරීමට ශ්‍රී ලංකාවට හැකි වන අතර, විදේශ වෙළඳපල තුල ශ්‍රී ලංකාවේ කීර්ති නාමය තව දුරටත් ආරක්ෂා කර ගනිමින් මෙම නිෂ්පාදන සඳහා පවතින විදේශීය වෙළඳපල තව දුරටත් පුළුල් කර ගැනීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය නිරතුරුවම ක්‍රියාත්මක වන අතර, විදේශීය ප්‍රදර්ශන වලට සහභාගී වෙමින් හා විදේශ වෙළඳ ගිවිසුම් නිසි පරිදි ලබා ගනිමින් අපනයන විවිධාංගීකරණය තුලින් නව විදේශ වෙළඳපලවල් අත්පත් කර ගැනීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් පවති. වසර කිහිපයක් ඇතුලත පොල් කර්මාන්තයෙන් දැනට ලබා ගන්නා පොල් ආශ්‍රිත අපනයන ආදායම දෙගුන කර ගැනීම පොල් සංවර්ධන අධිකාරියේ මූලික අරමුණයි.මේ සඳහා මා හට මගපෙන්වනු ලබන ගරු පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ජගත් පුෂ්ප කුමාර මැති තුමාටත්, ගරු නියෝජ්‍ය අමාත්‍ය වික්ටර් බී. ඇන්තනි මැතිතුමාටත්, අමාත්‍යාංශ ලේකම් නිහාල් සෝමවීර මහතා ඇතුළු අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලයටත්, පොල් ආශ්‍රිත නිෂ්පාදන කටයුතු වල යෙදෙන කර්මාන්ත කරුවන්ටත්, මෙම අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා මා හට නන් අයුරින් සහාය දක්වන පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තුමා, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිමි.

පොල් කර්මාන්තකරුවන් සඳහා වඩාත් විධිමත් සේවාවක් සැපයීමෙන් දේශීය හා විදේශීය වශයෙන් පොල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන තව දුරටත් පුළුල් කරමින් වැවිලි කර්මාන්ත අතර පොල් කර්මාන්තයෙන් ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය තව දුරටත් ඉහල නැංවීම සඳහා ඉදිරි වසර තුල ක්‍රියාත්මක වීම අපගේ පරමාර්ථයයි.

අරුණ ගුණවර්ධන
සභාපති
පොල් සංවර්ධන අධිකාරිය

ගැමි ජන ජීවන රටාව තුළ නිරන්තර පරිභෝජනය සඳහා භාවිතා කරනු ලබන පොල් වනාහී, ගැමි ජනයාට සැබෑම කප්රුකක් විය. ගැමි ජන ජීවිතයෙන් පරිභෝජනය ආරම්භ වූ පොල්, වර්තමානය වන විට සමස්ථ ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන රටාව හා බද්ධ වී ඇත. එනිසාවෙන් වර්තමානය වන විට එය සමස්ථ රටේම කප්රුක බවට පත් වී ඇත.

ගෘහස්ථ පරිභෝජනයෙන් එපිට විශාල විදේශ විනිමයක් ඉපයිය හැකි, විශාල වෙළඳ පොළ වටිනාකමක් ඇති විවිධ නිෂ්පාදනයන් නිෂ්පාදනය කළ හැකි කර්මාන්ත කරුවන් අතර තරඟකාරී මෙන්ම සුවිශේෂී ස්ථානයක් හිමිකර ගැනීමට පොල් ශාකය සමත්ව ඇත. සැබවින්ම පොල් යනු ගැමි ජන ජීවිතයෙන් පරිභෝජනය ආරම්භ කොට වර්තමානය වන විට ලෝකයේ රටවල් විශාල සංඛ්‍යාවක් පරිභෝජනය කරනු ලබන අංගයක් බවට පත් වී ඇත.

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට නව මුහුණුවරක් ලබා දෙමින් ආරම්භ කරන ලද පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යංශය ප්‍රමුඛ පොල් ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන රට පුරා ස්ථාපනය වීමත් සමඟ කර්මාන්ත කරුවන්ට එය මහඟු පිටුවහලක් විය. ඔවුන් තවදුරටත් දිරිමත් කිරීමේ අරමුණින් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ගරු ජගත් පුෂ්ප කුමාර මැතිතුමාගේ සංකල්පයකට අනුව 2011 – 2016 "කප්රුක නවෝදාව" ජාතික පොල් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක විය. මෙහිදී මෙම සංවර්ධන සැලැස්ම පාදක කර ගනිමින් ශක්තිමත්ව හා විධිමත්ව පාලනය වන කර්මාන්තයක් ලෙස පොල් කර්මාන්තය නඟා සිටුවීම ගරු අමාත්‍යතුමාගේ ප්‍රධාන අභිප්‍රාය විය. එයට පූර්ණ කාලීන සහයෝගය ලබා දෙමින් පොල් සංවර්ධන අධිකාරිය විසින් ඊට සාධාරණ මෙහෙයක් ඉටු කරන ලදී.

ගරු ජගත් පුෂ්ප කුමාර මැතිතුමාගේ හා ලේකම් තුමාගේ මඟ පෙන්වීම යටතේ පොල් සංවර්ධන අධිකාරිය විසින් 2014 වර්ෂයේ "කප්රුක නවෝදාව" ජාතික පොල් සංවර්ධන වැඩසටහන යටතේ කප්රුක නිපැයුම් පියස පවත්වාගෙන යාම, ඉවතලන පොල් කටු හා පොල් ලෙලි එක්රැස් කිරීමේ නව මධ්‍යස්ථාන හඳුනා ගැනීම හා පවත්වාගෙන යාම, ප්‍රාදේශීය වශයෙන් පුහුණු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් රැකියා අවස්ථා ඇති කරලීම ආදී සුවිශේෂී ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාවට නංවා මේ වන විට සාර්ථක ප්‍රත්ඵල ලබා කර ගෙන ඇත.

එමෙන්ම අපනයනයන් වඩාත් විධිමත්ව සිදුකිරීම සඳහා අපනයන ඉලක්ක කරගත් ගෘහස්ත කර්මාන්තකරුවන් සඳහා තාක්ෂණික හා පුහුණු මෙන්ම දැනුවත් කිරීමේ වැඩසටහන්ද පැවැත්වූ අතර 2014 වර්ෂයේදී ද විදේශිය වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීවීමට හා අපනයනකරුවන් සහභාගීකරවීමට පොල් සංවර්ධන අධිකාරිය වෙත අවස්ථාව උදාවිය. තවද 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල නව ගැණුම්කරුවන් හඳුනාගැනීම හේතුවෙන් තැඹිලි අපනයනයේ 208% ක පමණ වර්ධනයක් සිදුව ඇති බවද සඳහන් කරනු කැමැත්තෙමි.

පසුගිය වසරේදී ක්‍රියාත්මක වූ කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය මේ වසරේත් සාර්ථකව ක්‍රියාත්මක වූ අතර ඊට ප්‍රාදේශිය සංවර්ධන බැංකුව විසින් ලබා දුන් අනගි සහයෝගය ස්තුති පූර්වකව සිහිපත් කරමි. එමෙන්ම යහපත් නිෂ්පාදන ක්‍රමවේදය (GMP) සහතික කරණ වැඩසටහන මේ වසරේ අති සාර්ථක පියවරක් තබමින් උසස් තත්ත්වයේ නිෂ්පාදන රටට ලබා දීම හේතුවෙන් නිෂ්පාදන කරුවන් හා කර්මාන්ත ඇගයුමට ලක් කරමින්, ඔවුන් දිරි ගැන්වීමේ අභිප්‍රායෙන් කර්මාන්ත කරුවන් 49 කට පමණ GMP සහතික ලාභීන් බවට පත් කරන ලදී. එසේම මේ වසර තුළ අප ලැබූ තවත් ජයග්‍රණයක් නම් පාසිකුඩා සංචාරක උද්‍යානයේ පරිසර හිතකාමී පොල් කටු දහක උඳුනක් ස්ථාපනය කිරීමයි.

පොල් සංවර්ධන අධිකාරිය විසින් 2013 වසරේ සැලසුම් කළ පරිදි, නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් අන්තර්ජාලය හරහා පොල් වෙන්දේසිය සිදු කිරීමේ ක්‍රියාවලිය මේ වසරේ සාර්ථක ලෙස ඉටු කරමින් ජාත්‍යන්තර වෙළඳපොළ ජය ගැනීමට ද හැකියාව ලැබී ඇති බව සතුටින් සිහිපත් කිරීමට කැමැත්තෙමි. එමෙන්ම ගෘහස්ථ පොල් පරිභෝජනයේදී සිදු වන නාස්තිය අවම කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරණ වැඩසටහන් විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රචාරණ කටයුතු සිදු කිරීම හා ගෘහස්ථ පොල් පරිභෝජනයේදී ඉවත යන පොල් වතුර සුරක්ෂිතව එක් රැස් කොට එය ශක්ති ජනක පානයක් ලෙස සකසා අපනයනය කිරීම තුළින් ශ්‍රී ලංකාවට ගලා ආ විදේශ විනිමය ඉතා ඉහළය.

තවද මේ වසරේ පොල් සංවර්ධන අධිකාරිය හා කොළඹ විශ්ව විද්‍යාලය එක්ව කරනු ලැබූ සහයෝගීතා ගිවිසුමට අනුව GIS තාක්ෂණය මගින් ශ්‍රී ලංකාවේ පොල් වගා බිම් ප්‍රමාණය හා පොල් ගස් ගණනය කිරීමේ ක්‍රමවේදය මේ වන විට සාර්ථකව සිදු කරමින් පවතී. එසේම පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනය කිරීමේදී ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා “Ceylon Coconut ” යන සන්නාම නාමය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ද සාර්ථක ලෙස අවසන් කර ඇත.

පූර්ව වර්ෂයන්හිදී මෙන්ම මෙම වසරේදීද පොල් සංවර්ධන අධිකාරියේ කටයුතු සාක්ෂාත් කරගැනීම සඳහා ගරු ජගත් පුෂ්ප කුමාර අමාත්‍යතුමන් හා ලේකම්තුමන් විසින් කරනා ලද මහපෙන්වීම කෘතඥතා පූර්වකව සිහිපත් කරනු කැමැත්තෙමි. ශ්‍රී ලංකාවේ දේශීය පොල් කර්මාන්තය නඟා සිටුවීම මෙන්ම, විදේශීය වෙළඳපොල අවස්ථා වැඩි දියුණු කරගනිමින් තරඟකාරිත්ව අපනයන ක්ෂේත්‍රය ජයගැනීම සඳහා පොල් කර්මාන්තයේ නව පිබිදීමක් ඇති කරලීමට කටයුතු කළ හැකි බව අප විශ්වාස කරන්නෙමු.

**එම්. පී. එන්. එම්. වික්‍රමසිංහ**

අධ්‍යක්ෂ ජනරාල්

පොල් සංවර්ධන අධිකාරිය

**2014 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්**

1. ජී.ජී.ධනංජය නන්දසිරි මහතා
2. දිල්රුක්ෂි මහානාම මෙය
3. කේ.එන්. ගුනසේකර මහතා
4. ඊ.එස්.ඩී දයාරත්න මහතා
5. එන්.එස් වනසිංහ මහතා (අමාත්‍යංශ නියෝජිත)
6. ජ්.එම් ලලිත් ජීවානන්ද මහතා
7. ජ්.පී.එම් ද අල්විස් මිය
8. එන්.උදයංග මහතා
9. ඇලෙක්ස් නිශාන්ත මහතා
10. ආර්.සේමසිංහ මහතා (භාණ්ඩාගාර නියොජිත)
11. උපාලි සුරේන්ද්‍ර හෙට්ටිගේ මහතා (2014.02.18 දින සිට)

## සභාපති ඇතුළු අංශ ප්‍රධානීන්

1. අරුණ ගුණවර්ධන මහතා - සභාපති (2014.12.09 දින දක්වා)

   ඩී.එම්.එල් බණ්ඩාරනායක මහතා -වැ.බ.සභාපති (2014.12.15 දින සිට)

2. එම්.පී.එන්.එම්.වික්‍රමසිංහ මහතා -අධ්‍යක්ෂ ජනරාල්

3. ඒ.ටී.රණසිංහ මහතා -ඉංජිනේරු

4. එස්.එස්.පුරසිංහ මහත්මිය -අධ්‍යක්ෂිකා(තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ)

5. ජේ.එස්.බාලසූරිය මහතා -අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ)

6. එස්.එස්.රාජකරුණා මහත්මිය -අධ්‍යක්ෂිකා(පරිපාලන)

7. එම්.පී.සන්ධ්‍යා කාන්ති මහත්මිය - අධ්‍යක්ෂිකා(මුදල්)

8. ආර්.ජේ.ඒ.ෆොන්සේකා මහතා - අධ්‍යක්ෂ -සැකසුම් සංවර්ධන(2014.04.08 දක්වා)
   එච්.වී.පී.විජේවර්ධන මහතා - 2014.05.08 දින සිට

9. ඩබ්.එම්.ටී.එස්.වීරසූරිය මහතා -අභ්‍යන්තර විගණක

# 2014.12.31 දිනට සංවිධාන ව්‍යුහය




**කෙටි යෙදුම් :**

1. ජ්‍යෙෂ්ඨ කළ. - ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටම
2. ස/නි අධ්‍යක්ෂ- සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
3. කළ. මට්. - කළමණාකරණ මට්ටම
4. අභ්‍යන්තර වි.නිලධාරී- අභ්‍යන්තර විගණන නිලධාරී
5. පරි.නිලධාරී - පරිපාලන නිලධාරී
6. ආර්.පර්. නිලධාරී- ආර්ථික පර්යේෂණ නිලධාරී
7. සැ.සං.නිලධාරී - සැකසුම් සංවර්ධන නිලධාරී
8. තත්.පාලන නිලධාරී- තත්ත්ව පාලන නිලධාරී
9. කණි.කළ - කණිෂ්ඨ කළමණාකරණ මට්ටම
10. අලෙ.සං. හා.පර්. - අලෙවි සංවර්ධන හා පර්යේෂණ
11. තත්.පා.හා ආර. තත්ත්ව පාලන හා ආරක්ෂණ

# පටුන

පරිච්ඡේද අංක

සැකසුම් සංවර්ධන අංශය 01

තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය 02

අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 03

පරිපාලන අංශය 04

මුදල් අංශය 05

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 06

විගණකාධිපති වාර්තාව 07

## සැකසුම් සංවර්ධන අංශය

පොල් ආශ්‍රිත කර්මාන්ත ලියාපදිංචි හා සංවර්ධන/ නවීකරණය සඳහා අවශ්‍ය තාක්ෂනික හා මූල්‍ය සහය ලබාදීම, පොල් නිෂ්පාදන අපනයනය සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම, පොල් ත්‍රිකෝණයෙන් බැහැර ප්‍රදේශයන්හී පවතින විභවතාව පරිදි පොල් ආශ්‍රිත කර්මාන්ත බිහිකිරීමට සහය වීම, අගය වැඩි අපනයන නිෂ්පාදන සැකසීමට පරිසර හිතකාමී තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම හා එම ක්‍රමවේද ප්‍රචලිත කිරීම, සම්ප්‍රදායි අනාරක්ෂිත නිෂ්පාදන ක්‍රමවේද වෙනුවට වැඩිදියුණු කල තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම හා ප්‍රචලිත කිරීම, යෝග්‍ය තාක්ෂණ හඳුන්වාදීම තුලින් නිෂ්පාදන පිරිවැය අවම කරලීම, නව කර්මාන්ත ඇරඹීමට හා කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය තාක්ෂනය හා ප්‍රතිපාදන රාජ්‍ය බැංකු ණය සහන මගින් ලබා දීම, අපනයන වෙළඳපොල අවශ්‍යතාවයන්ට සරිලන අගය වැඩි නිෂ්පාදන සිදු කිරීම සඳහා කර්මාන්තකරුවන් දැනුවත් කිරීම හා පහසුකාරක සැපයීම හා තරගකාරී අපනයන වෙළඳපොල අවශ්‍යතාවයන්ට සරිලන ප්‍රමිතීන් පවත්වාගනිමින් පොල් නිෂ්පාදනයන් සිදු කිරීම සඳහා තත්ත්ව සහතික ක්‍රමවේද හඳුන්වාදීම, කර්මාන්තකරුවන්ට, අපනයනකරුවන්ට හා පාර්ශවකරුවන්ට නිෂ්පාදන පිළිබඳව අවශ්‍ය දත්ත හා තොරතුරු අන්තර්ජාල හරහා ලබාගැනීමට අවශ්‍ය පහසුකම්සැලසීම හා දැයට කිරුළ, දිවි නැගුම යන ජාතික වැඩසටහන් සඳහා දායකත්වය දැක්වීම ආදිය සැකසුම් සංවර්ධන අංශය විසින් සිදු කරන ප්‍රධාන කාර්යයන් වේ.

2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පහත දක්වා ඇත .

1.1 සැකසුම් ඒකක ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය
1.2 ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක සහ භෞතික ගුණාත්මක තත්ත්වය සහතික නිකුත් කිරීම
1.3 ස්ථාපිත කප්රුක නිපැයුම් පියස මධ්‍යස්ථාන ඵලදායීව පවත්වා ගැනීමට සහය වීම හා පාසිකුඩා පොල් සංස්කෘතික උද්‍යානයේ පොල් ආශ්‍රිත සැකසුම් හා ප්‍රදර්ශනාත්මක මධ්‍යස්ථාන ඇති කිරීමට කටයුතු කිරීම.
1.4 පොල් කටු හා පොල් ලෙලි එක්රැස්කර කර්මාන්තයට යොමු කිරීම.
1.5 පරිසර හිතකාමී පොල්කටු අඟුරු නිෂ්පාදන ක්‍රමවේදය හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම.
1.6 කප්රුක නිපයුම් දිරිය සහන බැංකු ණය යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.
1.7 කොහු මෝල් සඳහා වැඩිදියුණු කල තාක්‍ෂණික ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.
1.8 පොල් ආශ්‍රිත අමු ද්‍රව්‍ය බහුලව පවතින ප්‍රදේශයන් හඳුනා ගනිමින් ගැමි ආර්ථිකය නංවාලීම සඳහා ගෘහස්ත කර්මාන්ත ඇරඹීමට අවශ්‍ය තාක්ෂණික පුහුණුව හා සහය ලබාදීම.
1.9 ජාත්‍යන්තර වෙළඳපල තරගකාරීත්වය මුහුණදීම සඳහා ගුණාත්මක නිෂ්පාදන සිදුකිරීම, ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම හා සහතිකකරන (HACCP,ISO 22000) සඳහා නිෂ්පාදන ආයතන නවීකරණය කිරීම.
1.10 දිසිදි මෝල් සංවර්ධන අරමුදලේ ප්‍රතිපාදන සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රතිපූර්ණ කිරීමට පහසුකම් සැලසීම.
1.11 දැයට කිරුළ හා දිවිනැගුම ජාතික වැඩසටහන් සඳහා දායකත්වය දැක්වීම.

## 1.1 සැකසුම් ඒකක ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය

වර්ෂ 2014 දී දිසිදි පොල්, මේදය තරමක් ඉවත් කරන ලද දිසිදි පොල්, පොල් තෙල්, කොප්පරා, නැවුම් පොල් තෙල්, පොල් කිරි, පොල් කිරම, පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදන, කොහු, කොහු ආශ්‍රිත නිමි නිෂ්පාදන, පොල් කටු අඟුරු, සක්‍රිය කාබන් හා පොල් කටු ආශ්‍රිත විසිතුරු අත්කම් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තායතන 465ක් අධිකාරියේ ලියාපදිංචි කර ඇත.

| නිෂ්පාදනය | 2013 ලියාපදිංචි ගණන | 2014 ලියාපදිංචි ගණන |
|---|---|---|
| දිසිදි පොල් | 45 | 47 |
| මේදය තරමක් ඉවත් කරන ලද දිසිදි පොල් | 8 | 1 |
| පොල් තෙල් | 49 | 72 |
| කොප්පරා | 21 | 14 |
| නැවුම් පොල් තෙල් | 3 | 29 |
| පොල් කිරි/පොල් කිරම | 9 | 10 |
| පොල් වතුර/යුෂ ආශ්‍රිත නිෂ්පාදන | 2 | 3 |
| කොහු කෙඳි නිෂ්පාදන | 117 | 170 |
| කොහු ආශ්‍රිත නිමි නිෂ්පාදන | 48 | 78 |
| පොල් කටු අඟුරු | 2 | 26 |
| සක්‍රිය කාබන් | 7 | 5 |
| පොල් කටු ආශ්‍රිත විසිතුරු අත්කම් භාණ්ඩ නිෂ්පාදන | 2 | 10 |
| මුළු ගණන | **313** | **465** |

වගු අංක ***1-2013*** හා ***2014*** වර්ෂයන්හි ලියාපදිංචි නිෂ්පාදන ආයතන

මෙම වර්ෂයේදී දිසිදි පොල් මෙ.ටො.50 367.212 ක් නිපදවන ලද අතර ඊට දිසිදි පොල් මෝල් 47ක් දායක වී තිබුණි. ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක හා භෞතික ගුණාත්මක විශ්ලේෂණය සඳහා සැකසුම් සංවර්ධන අංශය විසින් එම නිෂ්පාදන වලින් ආදර්ශ ලබා ගෙන යොමු කිරීම හා එම කර්මාන්තශාලා අධීක්ෂණය කරන ලදී.

දිසිදි පොල් නිෂ්පාදනය (මෙ.ටො.) - 2013 හා 2014

**2013** හා **2014** වර්ෂයන් හී දිසිදි පොල් නිෂ්පාදනය සැලකීමේදී **2014** වර්ෂයේ විශාල වර්ධනයක් දක්නට ඇති අතර පසුගිය වසර හා සැසඳීමේදී එය **172%** ප්‍රගතියක් දැක්වේ.




2013 වර්ෂය තුලදී දිසිදි පොල් , පොල් තෙල්, කොප්පරා, නැවුම් පොල් තෙල්, පොල් කිරි, පොල් කිරම, පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදන, කොහු, කොහු ආශ්‍රිත නිමි නිෂ්පාදන, පොල් කටු අඟුරු, සක්‍රිය කාබන් හා පොල් කටු ආශ්‍රිත විසිතුරු අත්කම් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තායතන වල ලියාපදිංචිය සම්බන්ධයෙන් හා අධීක්ෂණ කටයුතු පිළිබඳව හා පසු විපරම් සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා, පරීක්ෂණ හා ආදර්ශ ගැනීම් වාර ගණන, බැංකු ණය ලබා දීම සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ චාරිකා ගණන 14247 ක් විය. දිසිදි නිෂ්පාදනවල ක්ෂුද්‍ර ජීව හා භෞතික ගුණාත්මක තත්ත්ව සහතික කිරීම් සඳහා නැව්ගත කරන්නන්ගේ ගබඩා හා ගුදම් පරීක්ෂා කර බැලීමට ක්ෂේත්‍ර චාරිකා 86 ක් සිදුකර ඇත. එහිදී දිසිදි පොල් මලු වලින් නැවත නියැදි ලබාගෙන විශ්ලේෂණය සඳහා රසායනාගාරය වෙත යොමු කරන ලදී.

## 1.2 ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක සහ භෞතික ගුණාත්මක තත්ත්වය සහතික නිකුත් කිරීම

- **දිසිදි පොල් සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම**

දිසිදි කර්මාන්තශාලාවල දෛනික නිෂ්පාදන වලින් අධිකාරියේ පරීක්ෂකවරුන් ලබාගන්නා නියැදි රසායනාගාරයේ දී පරීක්ෂා කිරීමෙන් පසු නිකුත් කරන ප්‍රතිපල මත මෙම තත්ත්ව සහතික නිකුත් කරනු ලැබේ.

මෙම වර්ෂය තුලදී නිපදවන ලද දිසිදි පොල් මෙ.ටො. 50,367.212 න් දෛනික නියැදි / ආදර්ශ 10,685 ක් ක්ෂුද්‍ර ජීවී, භෞතික හා විශේෂ ආදර්ශ ලබා ගෙන ඇත. දිසිදි පොල් කි. ග්‍රෑම් 50,367.212 වෙනුවෙන් තත්ත්වය සහතික 1588 ක් නිකුත් කර ඇත.

| අංක | මාස | 2013 සහතික නිකුත් කිරීම ( සැල්මොනෙල්ලා, භෞතික , ඇෆ්ලටොක්සින් හා සල්ෆර්ඩයොක්සයිඩ්) | 2014 සහතික නිකුත් කිරීම ( සැල්මොනෙල්ලා, භෞතික , ඇෆ්ලටෝක්සින් හා සල්ෆර් ඩයොක්සයිඩ්) |
|---|---|---|---|
| 01 | ජනවාරි | 65 | 108 |
| 02 | පෙබරවාරි | 68 | 81 |
| 03 | මාර්තු | 80 | 88 |
| 04 | අප්‍රේල් | 66 | 83 |
| 05 | මැයි | 84 | 67 |
| 06 | ජුනි | 65 | 94 |
| 07 | ජුලි | 83 | 208 |
| 08 | අගෝස්තු | 96 | 170 |
| 09 | සැප්තැම්බර් | 96 | 157 |
| 10 | ඔක්තෝබර් | 126 | 228 |
| 11 | නොවැම්බර් | 108 | 142 |
| 12 | දෙසැම්බර් | 91 | 162 |
| | මුළු ගණන | **1028** | **1588** |

වගු අංක *2 - 2014* වර්ෂයේදී නිකුත්කරන ලද සහතික ගණන

- **විශ්ලේෂණ සහතික / වාර්තා නිකුත් කිරීම**

ගැනුම්කරුවන්ගේ ඉල්ලීම පරිදි මේදය තරමක් ඉවත්කරනලද දිසිදි පොල්, දිසිදි පොල්වල විශේෂ ආදර්ශ, පොල් තෙල්, කොප්පරා, නැවුම් පොල් තෙල්, පොල් කිරි, පුන්නක්කු, කොහු කෙඳි හා කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන, ජලය, බැර ලෝහ, දිසිදි පොල්වල සම්පූර්ණ බැක්ටීරියා ඝනාවස පරීක්ෂාවන් ආදිය සඳහා වන රසායනාගාරය විශ්ලේෂණ ප්‍රතිඵල පාදක කොට ගෙන සහතික/වාර්තා නිකුත් කරන ලදී. මෙම වර්ෂයේ විශ්ලේෂණ සහතික/වාර්තා 984 ක් නිකුත් කර ඇත. එහි සවිස්තරාත්මක සටහනක් පහත දැක්වේ.

| අංකය | පරීක්ෂා කල අයිතම | 2013 වර්ෂයේ නිකුත් කරන ලද විශ්ලේෂණ සහතික/වාර්තා ගණන | 2014 වර්ෂයේ නිකුත් කරන ලද විශ්ලේෂණ සහතික/වාර්තා ගණන |
|---|---|---|---|
| 1. | මේදය තරමක් ඉවත්කරනලද දිසිදි පොල් | 62 | 88 |
| 2 | දිසිදි පොල්වල විශේෂ ආදර්ශ | 36 | 112 |
| 3 | පොල් තෙල් | 51 | 54 |

| | | | |
|---|---|---|---|
| 4 | කොප්පරා | - | 4 |
| 5 | නැවුම් පොල් තෙල් | 61 | 26 |
| 6 | පොල් කිරි | 9 | 8 |
| 7 | පුන්නක්කු | 4 | 4 |
| 8 | කොහු කෙඳි හා කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන | 160 | 145 |
| 9 | මාළු පොල් | - | 1 |
| 10 | අප ජලය | - | 16 |
| 11 | බීමට ගන්නා ජලය | - | 5 |
| 12 | බැර ලෝහ | 75 | 97 |
| 11 | දිසිඳි පොල්වල සම්පූර්ණ බැක්ටීරියා සනාවස පරීක්ෂාවන් | 264 | 424 |
| 12 | පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන | 1 | - |
| | **මුළු ගණන** | **723** | **984** |

වගු අංක 3 - 2014 වර්ෂයේ දී නිකුත් කල විශ්ලේෂණ සහතික ගණන

## 1.3 (අ) ස්ථාපිත කප්රුක නිපැයුම් පියස මධ්‍යස්ථාන ඵලදායීව පවත්වා ගැනීමට සහය වීම

ගෘහස්ත පරිභෝජනයේදී ඉවතලන ආර්ථික වටිනාකමින් යුත් පොල් ආශ්‍රිත දෑ අමුද්‍රව්‍ය වශයෙන් යොදාගනිමින් අමුද්‍රව්‍ය සුලභ ප්‍රදේශ හඳුනා ගෙන පිහිටුවන ලද නිපැයුම් මධ්‍යස්ථාන මගින් ප්‍රදේශයේ රැකියා වියුක්ත අයට රැකියා අවස්ථා සලසන ලැබේ. මෙම මධ්‍යස්ථානයන්හි අපනයන සඳහා වන අගය වැඩි නිෂ්පාදන සිදු කරන අතර එමගින් දල දේශීය ආදායම නංවාලීමට දායකත්වයක් දක්වයි. 2015 වර්ෂයේ නිපැයුම් මධ්‍යස්ථානයන්හි සංවර්ධනය පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| මධ්‍යස්ථානය | සේවක සංඛ්‍යාව | | 2013 වර්ෂයේ නිෂ්පාදන | 2014 වර්ෂයේ නිෂ්පාදන |
|---|---|---|---|---|
| | 2013 | 2014 | | |
| කුලීගෙදර | 12 | 14 | තාවාෂි බුරුසු 156700 | තාවාෂි බුරුසු 187,502 |
| වහරග්ගොඩ | 10 | 05 | තාවාෂි බුරුසු 77,761 | තාවාෂි බුරුසු 93,066 |
| මාවතලන්ද | 22 | 12 | තාවාෂි බුරුසු 153,900 | තාවාෂි බුරුසු 394,480 |
| නෙල්ලිය | 90-105 | 169 | තාවාෂි බුරුසු 541,944 | තාවාෂි බුරුසු 573,564 |
| පට්ටියවෙලගොඩ | 11 | 10 | රබර් මිශ්‍රිත කොහු මල් පෝච්චි 413,550 | රබර් මිශ්‍රිත කොහු මල් පෝච්චි 495,953 |
| නාගහමඩ | 07 | - | තාවාෂි බුරුසු 8,000 | නිෂ්පාදන කටයුතු සිදු නොකරයි |

වගු අංක 4 - නිපැයුම් මධ්‍යස්ථානයන්හි නිෂ්පාදන තොරතුරු

**(ආ) පාසිකුඩා පොල් සංස්කෘතික උද්‍යානයේ පොල් ආශ්‍රිත සැකසුම් හා ප්‍රදර්ශනාත්මක මධ්‍යස්ථාන ඇති කිරීමට කටයුතු කිරීම**

විදේශ සංචාරකයින්ගේ අවධානයට ලක්වූ ප්‍රදේශයක් වන පාසිකුඩා හි පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් පොල් උද්‍යානයක, පොල් සංස්කෘතික උද්‍යානයක් ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය විසින් තීරණය කරන ලදී. ඒ අනුව පොල් සංවර්ධන අධිකාරියේ කාර්යභාරය ලෙස පොල් ආශ්‍රිත භාණ්ඩ ප්‍රදර්ශනාත්මකව සැකසීම හා අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමට යෝග්‍ය පරිදි කුටි(කබානා) හතරක් සකස් කර කරන ලදී. මෙම කුටීන් හි පොල් කටු ආශ්‍රිත විසිතුරු අත්කම් භාණ්ඩ නිෂ්පාදනය, ලනු ඇඹරීම, පාපිසි සැකසීම හා කොසු ඉදල් සැකසීම සිදුකෙරේ. මීට අමතරව අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීම සඳහා කොහුමෝලක් ස්ථාපිත කරන ලදී. මෙහි 12 දෙනෙකු පමණ සේවය කරන අතර ඒවාහි භාරකාරීත්වය පොල් වගා කිරීමේ මණ්ඩලයට පවරන ලදී.

## 1.4 පොල් කටු හා පොල් ලෙලි එක් රැස්කර කර්මාන්ත සඳහා යොදා ගැනීම

ප්‍රයෝජනයට නොගෙන අපතේ යන පොල් ආශ්‍රිත අමු ද්‍රව්‍ය හඳුනාගනිමින් කර්මාන්තය සඳහා යෙදවීමේ අරමුනින් පොල් කටු හා පොල් ලෙලි එක්රැස් කර අලෙවි කිරීම/ ආශ්‍රිත කර්මාන්ත සිදු කිරීම මගින් ගෘහ/ස්වයං රැකියා උත්පාදනය කරනු ලැබේ.

මේ අනුව පොල් කටු එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන 41කින් පොල් කටු කිලෝ ග්‍රෑම් 1,765,316,ක් හා පොල් ලෙලි එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන 10කින් පොල් ලෙලි 549,100ක් රැස් කරන ලදී.

## 1.5 පරිසර හිතකාමී පොල් කටු අඟුරු නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම.

පොල් කටු අඟුරු නිෂ්පාදනය ට කර්මාන්තකරුවන් යොමු කිරීම මගින් ජාත්‍යන්තර වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් පවතින සක්‍රීය කාබන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය සපයනු ලැබේ. අධිකාරිය මේ සඳහා අවධානය යොමුකර පරිසර හිතකාමී පොල්කටු අඟුරු නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වාදී එම ක්‍රමවේද සාර්ථක ලෙස ක්‍රියාත්මක වන අතර මේ වන විට කර්මාන්තකරුවන් 35 දෙනෙකු නිෂ්පාදන කටයුතු සිදුකරනු ලැබේ. කර්මාන්තකරුවන් 8 දෙනෙකු අදාළ ක්‍රමවේදයේ 80%ක් නිමවා ඇති අතර කර්මාන්තකරුවන් 6 දෙනෙකු 50% ඉක්මවා ඇත. මේ තත්වය උදා කරගැනීම සඳහා අධිකාරිය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

1. අදාළ ක්‍රමවේදය පිලිබඳව දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

| | | | |
|---|---|---|---|
| මොනරාගල | -16 දෙනෙකු | කුලියාපිටිය | -32 දෙනෙකු |
| කොළඹ | -14 දෙනෙකු | රත්නපුර | -26 දෙනෙකු |
| කළුතර | -32 දෙනෙකු | මාතලේ | -25 දෙනෙකු |
| ගම්පහ | -29 දෙනෙකු | අම්පාර | -23 දෙනෙකු |
| මාතර | -37 දෙනෙකු | අනුරාධපුරය | -34 දෙනෙකු |
| කෑගල්ල- | 21 දෙනෙකු | ඇඹිලිපිටිය | -19 දෙනෙකු |
| ගාල්ල | -28 දෙනෙකු | යාපනය | -30 දෙනෙකු |
| හම්බන්තොට | -28 දෙනෙකු | | |

2. කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ. කොට්ඨාශ 13ක් නියෝජනය වන පරිදි නියෝජිතයන් 13ක් තොරා ප්‍රචාරක බැනර් හා පොලිසැක්ස් මලු 500 බැගින් බෙදා දීම.

3. කඩුවෙල ප්‍රදේශවාසීන් අතර පොල්කටු එක්රැස් කිරීම සඳහා පොලිසැක්ස් මලු 3500ක් බෙදා දීම.

## 1.6 කප්රුක නිපයුම් දිරිය සහන බැංකු ණය යෝජනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය/ නවීකරණය හා නව කර්මාන්ත ඇරඹීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සපුරා ගැනීමට සහය වීමේ අරමුණින් පොල් සංවර්ධන අධිකාරිය හා මහජන බැංකුව එක්ව ක්‍රියාත්මක කරන ලද බැංකුණය ලබාදීම තවදුරටත් සිදුකරන ලදී.

ඒ අනුව-
1. අධිකාරිය වෙත ලැබුණු ණය අයදුම්පත් ගණන -111
2. මහජන බැංකුව වෙත යොමුකළ ගණන -76
3. මහජන බැංකුව විසින් ලබා දුන් ණය ප්‍රමාණය -61 (මුළු ණය මුදල- රු.මිලියන 44.725)
4. අධිකාරිය විසින් පොලිය ලබා දුන් කර්මාන්තකරුවන් ගණන -88 (මුලු මුදල- රු. මිලියන 6.388 )

මෙයට අමතරව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින්ද ණය යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කල අතර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමෙන් අනතුරුව ණය අයදුම්පත් 126ක් ලැබිණ.

## 1.7 කොහු මෝල් සඳහා වැඩිදියුණු කල තාක්‍ෂණික ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.

මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රදේශ 25ක කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදන පිලිබදව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම සඳහා සංවර්ධන නිලදාරීන් හා එක්ව වැඩසටහන් 25ක් පවත්වන ලදී.

තාක්ෂණයෙන් වැඩිදියුණු කරන ලද පෙට්ටිකූට්ටම් යන්ත්‍ර 4ක් මොනරාගල දිස්ත්‍රික්කයේ දමේන්ගල, නන්නපුරාව,දඹගල්ල හා කුඩාඔය යන ප්‍රදේශයන්හි කොහු කර්මාන්තකරුවන් 4 දෙනෙකුට ලබා දෙන ලදී. කොහු මෝල් සංවර්ධනයට අවශ්‍ය කන්වේයර් පද්ධති සවිකිරීම සම්බන්ධයෙන් ආයතන/ පුද්ගලයන් හඳුනා ගැනීමට පුවත්පත් දැන්වීම් පල කරන ලදී. ඊට 20 දෙනෙකු/ආයතන විසින් ප්‍රතිචාර දක්වන ලදී.මෙම පහසුකම ලබා ගැනීම සඳහා කර්මාන්තකරුවන් 182ක් ඉල්ලුම් කල අතර එම තොරතුරු කන්වේයර් පද්ධති සකස් කරන්නන් වෙත ලබා දී ඇත.

## 1.8 පොල් ආශ්‍රිත අමු ද්‍රව්‍ය බහුලව පවතින ප්‍රදේශයන් හඳුනා ගනිමින් ගැමි ආර්ථිකය නංවාලීම සඳහා ගෘහස්ත කර්මාන්ත ඇරඹීමට අවශ්‍ය තාක්ෂණික පුහුණුව හා සහය ලබාදීම.

**(අ) <u>පුහුණු වැඩසටහන්</u>**

පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙන ලෙසට කප්රුක සමිති විසින් සිදුකරන ලද ඉල්ලීම් පදනම් කරගනිමින් එම ප්‍රදේශයේ පවත්නා අමුද්‍රව්‍ය සුලභතාවය, නිෂ්පාදන සඳහා වන වෙළඳපොල අවශ්‍යතාව හා අලෙවිය යන කරුණු සැලකිල්ලට ගෙන පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

| අංකය | පුහුණු වැඩසටහන | පැවැත්වූ ප්‍රදේශය | සහභාගී වූ සංඛ්‍යාව | සහභාගී වූ මුලු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ඉදල් හා මුසුන් නිෂ්පාදනය | හම්බන්තොට<br>ඉපලෝගම<br>පල්ලේපොල<br>ගම්පහ | 23<br>91<br>37<br>23 | 174 |
| 2 | තවාශි බුරුසු නිෂ්පාදනය | කටුවැල්ලේගම<br>බණ්ඩාරගම<br>වාරියපොළ<br>පුත්තලම<br>හේනේගම<br>පලාවුවගොඩ<br>වල්පොල<br>උඩුගම්පොල<br>කොස්ගම<br>හොරණ<br>මුන්දලම<br>නිකවැරටිය | 32<br>27<br>33<br>30<br>13<br>20<br>33<br>32<br>35<br>26<br>25<br>28 | 586 |

| | | | | |
|---|---|---|---|---|
| | | පල්ලෙවෙල<br>රත්තොට<br>හෝමාගම<br>කටුවන<br>හම්බන්තොට<br>පිටබැද්දර<br>දෙහිඅත්තකන්දිය<br>බණ්ඩාරගම<br>ගම්පහ | 35<br>35<br>22<br>40<br>40<br>21<br>10<br>24<br>25 | |
| 3 | පොල්කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | රිදීමාලියද්ද<br>මහර බන්ධනාගාරය<br>මුන්දලම<br>ගම්පහ<br>මාතලේ<br>හෝකන්දර | 28<br>20<br>25<br>44<br>20<br>15 | 152 |
| 4 | පොල් කෙඳි මාල සැකසීම | මහර බන්ධනාගාරය | 15 | 15 |
| 5 | පාපිසි සැකසීම | අඟුනකොලපැලැස්ස<br>පොතුපිටිය<br>තිස්සමහාරාමය | 29<br>58<br>48 | 135 |
| 6 | සුදු පොල් තෙල් නිෂ්පාදනය | දෙමටපිටිය | 34 | 34 |
| | | මුළු ගණන | | **1096** |

**(ආ) උපකරණ කට්ටල බෙදාදීම**

සාර්ථකව පුහුණුව අවසන් කරන ලද පුහුණු ලාභීන් අදාළ කර්මාන්තය අඛණ්ඩව සිදු කිරීම සඳහා සහන මිලට ඔවුන් විසින් ඉල්ලුම් කරන ලද උපකරණ/ මෙවලම් ලබා ඊමට කටයුතු කරන ලදී. අදාළ තොරතුරු පහත දැක්වේ.

| අංකය | උපකරණ කට්ටලයේ නම | ප්‍රදේශය | ලබාදුන් ගණන | මුළු ගණන |
|---|---|---|---|---|
| 1 | තවාෂි දහ දමන උපකරණ | බණ්ඩාරගම<br>ගල්නෑව<br>කටුවැල්ලේගම<br>ගලේවෙල<br>පුත්තලම<br>බමුනුකොටුව<br>රත්තොට<br>මාතර<br>පුත්තලම<br>වල්පිට<br>ගම්පහ<br>පොලොන්නරුව | 26<br>27<br>01<br>17<br>08<br>05<br>05<br>04<br>15<br>10<br>08<br>05 | 131 |

| | | | | |
|---|---|---|---|---|
| 2 | ඉදල් හා මුසුන් උපකරණ | ගම්පහ<br>මාතලේ<br>ගලගෙදර<br>කොළඹ<br>කුරුණෑගල | 05<br>11<br>01<br>01<br>01 | 19 |
| | | මුළු ගණන | | **150** |

වගු අංක *06*-උපකරණ කට්ටල බෙදාදීම

**(ඇ)** **<u>දැනුවත් කිරීමේ වැඩසටහන්</u>**

පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත සිදු කිරීම, නව කර්මාන්ත ඇරඹීම කර්මාන්තකරුවන් හට පවත්නා ගැටළු වලට පිළියම් ලබා දීම, අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන නව වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීම, මූල්‍ය සහන ලබා දීම පිළිබඳව දැනුවත් කිරීම, ගුණාත්මක නිෂ්පාදන හා අගය වැඩි නිෂ්පාදන සිදු කිරීමේ වැදගත් කම පිලිබඳ දැනුවත් කිරීම, ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම හා පිලිගත් සහතිකකරන සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීම සම්බන්ධව දැනුවත් කිරීම ආදී වශයෙන් දිවයින පුරා වැඩසටහන්/ සාකච්ඡා/ වැඩමුළු 29ක් පවත්වන ලදී.

**(ඇ)** **<u>ඉදිරිපත් කිරීම්</u>**

පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත පිළිබඳව පාසල් සිසුන්, මහජනතාව, කර්මාන්තකරුවන්, පාර්ශ්වකරුවන් හට බහුමාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීම් (Presentations) 7ක් සිදුකරන ලදී.

## 1.9 ජාත්‍යන්තර වෙළඳපල තරගකාරීත්වය මුහුණදීම සඳහා ගුණාත්මක නිෂ්පාදන සිදුකිරීම, ප්‍රමිතීන් යාවත්කාලීන කිරීම හා සහතිකකරන (HACCP,ISO 22000) සඳහා නිෂ්පාදන ආයතන නවීකරණය කිරීම.

දිසිඳි පොල් කර්මාන්තය සඳහා 2013 වර්ෂයේදී හඳුන්වා දෙන ලද යහපත් නිෂ්පාදන භාවිතයන් (GMP) අඛණ්ඩව සිදුකල අතර, සාර්ථකතත්වයට පත් දිසිඳි කර්මාන්තායතන 47කට උත්සවාකාරයෙන් සහතික 2014 වසරේ දී ප්‍රධානය කරන ලදී.

2වන අදියර වශයෙන් දිසිඳි පොල් කර්මාන්තය සඳහා HACCP සහතිකකරණ හඳුන්වාදීමට කටයුතු කරන ලදී. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සුදුසු නියෝජිත ආයතනයක් හඳුනා ගත් අතර එම ආයතනය විසින් අදාළ කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය උපදේශන ලබා දෙනු ලැබේ. මෙම සහතිකකරණයට අදාලවදිසිඳි පොල් ආයතන 38ක් කටයුතු කරමින් පවතින අතර අදාළ අත්පොත් කර්මාන්තකරුවන් අතරේ බෙදා දෙන ලදී.

ආරම්භයේ දී මෙම සහතිකකරනයේ ඇති වැදගත්කම වටහා දීම සඳහා වැඩමුළු හා දැනුවත් කිරීම් සිදු කල අතර ඊට කර්මාන්ත හිමියන්, ආයතන සේවකයින් හා අදාළ අධිකාරියේ කාර්යය මණ්ඩලය ද සහභාගී වුහ.

## 1.10 දිසිදි මෝල් සංවර්ධන අරමුදලේ ප්‍රතිපාදන සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රතිපූර්ණ කිරීමට පහසුකම් සැලසීම.

දිසිදි කර්මාන්තශාලාවල සංවර්ධන කාර්යයන්/ නවීකරණ කටයුතු කිරීම සඳහා දිසිදි මෝල් සංවර්ධන අරමුදලෙන් මුදල් ප්‍රතිපූර්ණ කිරීමේ හැකියාව පවතී. අධිකාරිය විසින් අනුමත කරන ලද අදාළ සංවර්ධන කාර්යය නිම කිරීමෙන් අනතුරුව අවශ්‍ය ලේඛන හා බිල් පත් අධිකාරිය වෙත යොමු කිරීමෙන් අනතුරුව අවශ්‍ය පරීක්ෂාවන්ගෙන් පසු ගෙවීම් සිදු කරනු ලැබේ. මේ අනුව 2014 වර්ශයෙදී දිසිදි නිෂ්පාදන ආයතන 20ක් සඳහා සිදු කරන ලද සංවර්ධන කාර්යයන් වෙනුවෙන් රු.මිලියන 20.436ක් ප්‍රතිපූර්ණ කරන ලදී.

## 1.11 දැයට කිරුළ හා දිවිනැගුම ජාතික වැඩසටහන් සඳහා දායකත්වය දැක්වීම.

**(අ)** 2014 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය කුලියාපිටිය කාර්මික විද්‍යාලය, විශ්ව විද්‍යාලය හා මධ්‍ය මහා විද්‍යාල පරිශ්‍රයන්හි පැවති අතර ඊට පොල් සංවර්ධන අධිකාරියේ දායකත්වයද ලබා දෙන ලදී. මහජනතාව දැනුවත් කිරීම සඳහා සජීවීව ඉදල් හා මුසුන්, පොල් කටු විසිතුරු භාණ්ඩ නිෂ්පාදන පාපිසි හා ඉරටු ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ලදී. මීට අමතරව පරිසර හිතකාමී පොල් කටු අඟුරු නිෂ්පාදන ක්‍රමවේද එම ස්ථානයේදී ප්‍රායෝගිකව සිදු කරන ලදී. ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත්ව තිබූ සියලු කුටි අතරින් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය අයත් කුටිය 1 ස්ථානය අත්කරගන්නා ලද අතර වඩාත් ඵලදායී කුටියක් ලෙස සැකසීමට සැකසුම් සංවර්ධන අංශය ඉහල දායකත්වයද ලබා දෙන ලදී.

මෙයට සමගාමීව පුත්තලම, කුරුනෑගල, කෑගල්ල යන දිස්ත්‍රික්කයන්හි ලනු,ඉදල් හා මුසුන් හා තවෂි බුරුසු යන නිෂ්පාදන සැකසීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් 10ක් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 3ක් පවත්වන ලදී.

**(ආ)** ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දිවි නැගුම ජාතික වැඩසටහන සඳහා පොල් සංවර්ධන අධිකාරියේ දායකත්වය ලබා දෙන ලදී. ඒ අනුව පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සඳහා පහත දක්වා ඇති ප්‍රදේශයන්හි කර්මාන්තකරුවන් අතර උපකරණ කට්ටල බෙදා දෙන ලදී.

- යාපනය - ඉදල් හා මුසුන් උපකරණ කට්ටල 05
- මාතලේ - ඉදල් හා මුසුන් උපකරණ කට්ටල 18
- කෑගල්ල - ඉදල් හා මුසුන් උපකරණ කට්ටල 12
- මඩකලපුව - ඉදල් හා මුසුන් උපකරණ කට්ටල 06
- බදුල්ල - පොල් කටු ආශ්‍රිත උපකරණ කට්ටල 36
- ගාල්ල - පොල් කටු ආශ්‍රිත උපකරණ කට්ටල 26

## 02. තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය

තත්ව පාලන කටයුතු පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මගින් අපනයන තොග වල ගුණාත්මක භාවය සහතික කිරීම, විවිධ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා පරිදි පරීක්ෂණ පහසුකම් සැපයීම, පොල් නිෂ්පාදන දේශිය වෙළඳ පොලට යොමු වීමේදි පරීක්ෂා කොට සහතික නිකුත් කිරීම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන උසස් මට්ටමක පවත්වා ගැනීම සඳහා උපදේශකත්වය සැපයීම තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධාන වගකීමයි.

අංශයේ කාර්යයන්;

- **අපනයනය සඳහා යොමු වන දිසිදි පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම හා තත්වය සහතික කිරීම**
  පොල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම මද ආශ්‍රිත නිෂ්පාදනය වන දිසිදි පොල් කර්මාන්තය ප්‍රධාන වශයෙන් මනා තත්ව පාලනයකට යොමු කරන අතර දෛනික දිසිදි පොල් නිෂ්පාදන සියල්ල තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේදී දිනපතා පරීක්ෂාවට භාජනය කෙරේ. අපනයනය සඳහා යොමු වන මෙම නිෂ්පාදන සඳහා තත්ව සහතික නිකුත් කිරීම පිණිස මෙම පරීක්ෂණ ප්‍රතිඵල දායක වේ.
- **පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන්, අපනයනකරුවන් හා පාරිභෝගික ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සේවාවක් ලෙසට රසායනාගාර පරීක්ෂණ සේවා, සහන ගාස්තු ක්‍රමයක් යටතේ සිදුකිරීම.**
  ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ප්‍රමිතීන් හි දැක්වෙන ක්ෂුද්‍රජීවී හා භෞත රසායනික පරීක්ෂා සිදුකිරීමේ හැකියාව පොල් සංවර්ධන අධිකාරියේ තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය සතු වන අතර පොල් කර්මාන්තයේ නියැළි ව්‍යවසායකයන්ගේ අභිවෘද්ධිය සඳහා කඩිනම් පරීක්ෂණ සේවාවන් ලබාදීමට සෑම විටම කටයුතු කරනු ලැබේ.
- **දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී, භෞත රසායනික පරීක්ෂා සිදුකිරීම.**
  අධිකාරියේ රසායනාගාරයේ සිදුකරන පරීක්ෂා හැරුණු කොට ජංගම රසායනාගාර සේවා මගින් පොල් නිෂ්පාදන ක්‍රියාවලීය වැඩි දියුණු කිරීම හා නිෂ්පාදනයන්හි උසස් ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා ක්ෂුද්‍රජීවී සහ රසායනික පරීක්ෂා සිදුකරනු ලැබේ.

  මීට අමතරව

- පොල් නිෂ්පාදන සිදුකරනු ලබන කර්මාන්ත ශාලා සඳහා තාක්ෂණික සහය ලබාදීම, කර්මාන්ත ශාලා පරීක්ෂා කිරීම සහ උපදේශක දායකත්වය සැපයීම,
- තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ රසායනික හා ක්ෂුද්‍රජීවී රසායනාගාර සඳහා ISO 17025 තත්ව සහතිකය ලබා ගැනීමේ කටයුතු සිදුකිරීම,

- ක්ෂුද්‍රජීවී විෂගතවීම් වැනි තත්වයන් හමුවේ දිසිදි පොල් නිෂ්පාදන කර්මාන්ත ශාලා විශේෂ පරික්ෂාවට (Swab tests) භාජනය කිරීම සහ රසායනාගාර පරීක්ෂා සිදුකර උපදේශකත්වය සැපයීම,
- පොල් තෙල් කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීම හා නගාසිටුවීම අරමුණු කරගනිමින් පොල් තෙල් නිෂ්පාදනාගාරයන් හි සෞඛ්‍යාරක්ෂිත භාවය පරික්ෂා කිරීම හා පොල් තෙල් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍යා වන කොප්පරා, නිෂ්පාදිතය වන පොල් තෙල් හා එහි අතුරුඵලය වන පුන්නක්කු ශ්‍රී ලංකා ප්‍රමිතින්ට අනුකූල වන්නේදැයි පරික්ෂා කිරීම,
- දේශිය වෙළඳ පොලෙහි පවතින පොල් තෙල් නිෂ්පාදනයන්හි තත්වය පරික්ෂා කිරීම සිදුකරන අතර හඳුනාගත් මිශ්‍ර පොල් තෙල් විකුණුම්කරුවන් පිළිබඳ විස්තර පාරිභෝගික කටයුතු පිළිබඳ වන පාරිභෝගික අධිකාරිය සහ ආහාරමය ද්‍රව්‍ය සඳහා පාලනමය බලතල ඇති ආයතනය වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත සපයා එකී ආයතන සමඟ එක්ව කටයුතු කර මිශ්‍ර පොල් තෙල් අනුභවයෙන් පාරිභෝගික ජනතාව රැකගැනීම සඳහා සේවාවන් සැපයීම,
- පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව පැන නැගෙන දේශිය හා විදේශිය පැමිණිලි හමුවේ නිෂ්පාදන පරික්ෂණ සිදුකිරිම,
- පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි වැදගත් කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් සහ ප්‍රදර්ශණ සඳහා සහභාගී වීම,
- ආහාරමය වෙනත් නිෂ්පාදන පරික්ෂා කිරීමේ සේවාවන් පවත්වා ගෙන යාම,
- ජල විශ්ලේෂණ කාර්යයන් සිදුකිරීම,
- වර්තමානයේ පවතින ශ්‍රී ලංකා ප්‍රමිතින් යාවත්කාලීන කිරීම සහ දැනට ප්‍රමිතින් නොමැති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමිති සැකසීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සම්බන්ධවී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම,
- පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ පවතින රසායනාගාරයන්හි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය උදෙසා පුහුණු වැඩ සටහන් පැවැත්වීම යනාදිය සිදුකරනු ලැබේ.

මේ අනුව ගුණාත්මක පොල් නිෂ්පාදන බිහිකිරිමත්, ඒ අනුව දේශීය හා විදේශිය වෙළඳපල වර්ධනය විමත් අපේක්ෂා කරමින් පොල් නිෂ්පාදන පරික්ෂා කිරීම තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකර ඇත. මෙම සේවාව වඩාත් ප්‍රමිතියානුකූලව සැපයීම සඳහා රසායනාගාර වෙනුවෙන් ISO 17025 තත්ව සහතිකය හා අදාල කාර්යයන් සිදුකරනු ලැබේ. මෙකී සියළු කාර්යයන්, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මකට අනුව සිදුකරනු ලබන අතර 2014 වාර්ශික ප්‍රගතිය පහත පරිදි වේ.

## Q1 අපනයනය සහ දේශිය පරිභෝජනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන්හි තත්වය සහතික කිරීම

### A පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ සිදුකිරීම සහ සහතික කිරීම

පොල් මද ආශ්‍රිත නිෂ්පාදනයන්හි පරික්ෂණ කටයුතු ප්‍රධාන වශයෙන් සිදුවන්නේ දිසිදි පොල් සඳහා වේ. දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි සිදුවන දෛනික නිෂ්පාදන, සැල්මොනෙල්ලා පරික්ෂාවට භාජනය කිරීම, තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ ක්ෂුද්‍රජීවි රසායනාගාරයේදී සිදුකෙරේ. මේ අනුව අපනයනය සඳහා යොමුවන දිසිදි පොල් නිෂ්පාදනයන් සියල්ල පරික්ෂාවට භාජනය කෙරේ.

2014 වසර සඳහා දෛනික දිසිදි නිෂ්පාදන ආදර්ශ 10500ක ඉලක්කයක් තිරණය කරන ලදි. ආදර්ශ 11609ක් සැල්මොනෙල්ලා සඳහා පරික්ෂා කර 2014 වසරේදි මෙම පරික්ෂණ වෙනුවෙන් 111% ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

දිසිදි ආදර්ශ පරික්ෂා කිරීමට, යොමුවීම එම නිෂ්පාදන ධාරිතාවය මත රදා පවති.




2013 වසරේදි පරික්ෂාවට භාජනය කල දිසිදි පොල් නිෂ්පාදන අතුරින් ආදර්ශ 09ක් සැල්මොනෙල්ලා විෂගතවීම වාර්තා විය. ප්‍රතිශතයක් ලෙස විෂගතවීම 0.14%කි. 2014 වසරේදි විෂගතවීම ආදර්ශ 17ක් වන අතර 2014 වසරේදි පරික්ෂාවට භාජනය කල ආදර්ශයන්හි ප්‍රතිශතයක් ලෙස ගත්කල මෙය 0.15% වේ. ඒ අනුව විශගතවීම සුළු වශයෙන් වැඩිවී ඇත. (0.01%)




| වසර | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|
| විෂගතවීම් ප්‍රතිශතය | 0.50% | 0.10% | 0.12% | 0.12% | 0.2% | 0.08% | 0.14% | 0.15% |

පූර්ව අපනයන ක්ෂුද්‍රජීවී විශ්ලේෂණය සිදුකිරීම සඳහා මද නොවන නිෂ්පාදන අතුරින් ප්‍රමුඛත්වය ගනු ලබන්නේ කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයි. 2013 වසරේදී ආදර්ශ 800ක් පරික්ෂා කර ඇති අතර 2014 වසරේදී ආදර්ශ 840ක් පරික්ෂා කර ඇත. මෙම ආදර්ශ 840 හි පරික්ෂණ 1034ක් සිදුකර ඇත. 2014 වර්ෂයේදී කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව, වැඩි ප්‍රමාණයක් පරික්ෂා සඳහා භාජනය වී ප්‍රගතිය 105%ක් ලෙස වාර්තා වී ඇත. මෙම අදාර්ශයන්හි සැල්මොනෙල්ලා සහ ඊකොලි පරික්ෂාවන් සිදුකරනු ලැබේ. පරික්ෂා කල ආදර්ශ අතුරින් 4% ක් සැල්මොනෙල්ලා විශගතවීම් වාර්තා වි ඇති අතර කිසිදු ආදර්ශයක් ඊකෝලයි බැක්ටිරියාව සඳහා වන ප්‍රමිති සීමාවන් ඉක්මවා නැත.



## B දිසිදි පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන භෞත රසායනික පරික්ෂා සිදුකිරිම සහ සහතික කිරිම.

භෞතික හා සංවේදි පරික්ෂා ලෙස,

දිසිදි පොල් හි වර්ණය, කැටිති ප්‍රමාණය, තෙතමනය, රස, සුවඳ, අපද්‍රව්‍ය, කුරුටු, තෙල් බේරි ඇත්ද යන පරික්ෂා ප්‍රධානව සිදුකර ඇත. මේ අනුව 2013 වසරේදි ආදර්ශ 6509ක් පරික්ෂා කර ඇති අතර 2014 වසරේදි ආදර්ශ 11706 ක් පරික්ෂා කර ඇත. මෙම ආදර්ශ 11,706 හි සිදුකර ඇති සම්පූර්ණ පරික්ෂණ ගණන 93648 කි. 2014 වසරේ ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 111% කි.




| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|
| ආදර්ශ ප්‍රමාණය | 9913 | 8381 | 8333 | 6586 | 10307 | 9381 | 6509 | 11706 |
| ඉලක්කය | 10250 | 8750 | 8500 | 8400 | 6800 | 9500 | 6500 | 10400 |

2013 වර්ෂය තුල පරික්ෂණයට භාජනය කල දිසිදි ආදර්ශ 6509 අතුරින් ආදර්ශ 254ක් එනම් 3.9%ක් භෞතික ලක්ෂණයන්හි අඩුපාඩු පෙන්නුම් කරන ලද අතර 2014 වර්ෂයේදි පරික්ෂා කල ආදර්ශ 11,706න් ආදර්ශ 733 එනම් 6.27%ක් එම අඩුපාඩු පෙන්වා ඇත. මේ අනුව භෞතික ලක්ෂණයන්හි ප්‍රමිතියානුකූල නොවීම 2014 වර්ෂයේදි ඉහල ගොස් ඇත. මෙලෙස ශ්‍රී ලංකා ප්‍රමිතිය හා එකඟ නොවූ ආදර්ශ අතුරින් වැඩිම ප්‍රතිශතය වන 60% ක් සියුම්, මධ්‍යම යන වර්ග සඳහා වන ප්‍රමිතියට නොගැලපීම පෙන්වා ඇත. සෙසු දෝශ පහත පරිදි වේ.

| පරාමිතිය | එකඟ නොවූ ආදර්ශ | |
|---|---|---|
| | ගණන | % |
| වර්ග කිරීම | 443 | 60.44 |
| වර්ණය | 187 | 25.5 |
| මුඩු බව | 63 | 8.6 |
| තෙතමනය | 54 | 7.4 |
| දැවුනු කැබලි | 53 | 7.2 |
| කර ගඳ | 32 | 4.4 |
| දුම් ගඳ | 23 | 3.14 |
| බාහිර අපද්‍රව්‍ය | 13 | 1.2 |
| කුරුටු | 12 | 1.64 |
| තෙල් බේරීම | 5 | 0.7 |
| කැඩුනු කැබලි | 4 | 0.6 |
| තෙල් සහිතවීම | 3 | 0.4 |

ඇතැම් ආදර්ශ පරාමිතින් කිහිපයකින් ප්‍රමිතිය හා එකඟ නොවී ඇත.

## Q2. පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවා පවත්වා ගැනීම

දේශිය නිෂ්පාදකයන්ගේ විවිධ පොල් නිෂ්පාදන විශ්ලේෂණය කිරීම්, සේවාව පවත්වා ගැනීම තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකරයි. ක්ෂුද්‍රජීවී පරීක්ෂාවන්, රසායනික පරීක්ෂාවන්, භෞතික පරීක්ෂාවන් සහ සංවේදී පරීක්ෂාවන් මේ යටතේ සිදු කෙරේ. මෙම සේවාව සාධාරණ මිලකට, සිදුකරන අතර ඉල්ලුම් කරුගේ අවශ්‍ය පරාමිතින්ට අදාලව පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලැබේ. පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්, පාරිභෝගික ජනතාව, සුළු, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳ මහතුන් සහ අපනයන කරුවන් ආදී වූ ඕනෑම කාණ්ඩයක් සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සේවාව ලබා දෙනු ලැබේ.

මද වශයෙන් මේදය ඉවත් කල දිසිදි පොල්, කොප්පරා, පොල් කෙඳි, පොල් තෙල්, පුන්නක්කු, කොහු බත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් කිරි හා කිරි ආශ්‍රිත වෙනත් නිෂ්පාදන ආදි වූ විවිධ පොල් නිෂ්පාදන ද්‍රව්‍යයන් ශ්‍රී ලංකා ප්‍රමිතියට අදාලව පරීක්ෂා කිරීමේ සේවාව පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා අවශ්‍ය වන නවීන රසායනාගාර උපකරණ, තත්ව පාලන අංශය සතු වන අතර කඩිනම් ප්‍රතිඵල ලබාදීම තත්ව පාලන අංශයෙන් සිදුකරනු ලැබේ.

ප්‍රමිතියානුකුල ලෙස පොල් ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා පරික්ෂා කර එහි තත්වයන් පිළිබඳව අවබෝධය ලබා ගැනිම උදෙසා නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහාත්, ශ්‍රී ලාංකික භාවය රැකෙන පරිදි තත්වයෙන් උසස් පොල් නිෂ්පාදන නිරතුරුව විදේශිය වෙළඳපල කරා යොමු කරවීම පිණිස අපනයන කරුවන් දිරිගැන්වීම සඳහාත්, පොල් සංවර්ධන අධිකාරියෙහි ඉහත කී ලියාපදිංචි කාණ්ඩ සඳහා වට්ටම් ගාස්තුවක් යටතේ මෙම පරික්ෂණ කඩිනමින් සිදුකරනු ලැබේ.

පරික්ෂා කර ගැනීම සඳහා පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රධාන වශයෙන් යොමුවන අතර 2013 වසරේදි ආදර්ශ 591ක් පරික්ෂා කර ඇත. 2014 වසර තුල ඉල්ලුම් කරුවන්ගේ අවශ්‍යතාව මත ආදර්ශ 1094ක් විශ්ලේෂණයකර ඇත. මීට අමතරව පොල් නොවන නිෂ්පාදන ආදර්ශ 05ක් ද 2014 වසරේදි විශ්ලේෂණය කර ඇති අතර මේ අනුව සම්පුර්ණ ආදර්ශ ගණන 1099 කි. ඉලක්කය වන ආදර්ශ 1000ට සාපේක්ෂ ප්‍රගතිය 109% වේ. මෙම ආදර්ශ 1099 හි සිදුකර ඇති සම්පුර්ණ පරික්ෂණ ගණන 1969 කි. 2014 වසරේදි පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අතුරින් සල්ෆඩයොක්සයිඩ් හා ඇෆ්ලටොක්සින් පරික්ෂණ සඳහා පමණක් දිසිදි ආදර්ශ 710ක් විශ්ලේෂණය කර ඇත. මෙය පරික්ෂා කල මුළු ආදර්ශ ප්‍රමානයෙන් 64.6%කි. පරික්ෂා කල සෙසු ආදර්ශ වර්ග පහත දැක්වේ.

පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පරික්ෂා කිරිමේ සේවාවන් පවත්වා ගැනීම




| වර්ෂය | දිසිදි පොල් (ආදර්ශ) | පුන්නක්කු (ආදර්ශ) | පොල් තෙල් (ආදර්ශ) | කොප්පරා (ආදර්ශ) | මද වශයෙන් මේදය ඉවත් කරන ලදි දිසිදි පොල් (ආදර්ශ) | ගෙඩි පොල් | පොල් ක්‍රීම්/ පිටි | පොල් කටු අඟුරු | පොල්මය ආහාර | පොල් නොවන ආදර්ශ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2013 | 67 | 04 | 190 | -- | 76 | -- | 20 | 01 | 01 | 01 |
| 2014 | 122 | 5 | 161 | 4 | 81 | -- | 11 | -- | -- | 05 |

## Q3. A) ISO තත්ව සහතිකය ලබා ගැනීමේ කාර්යයන්

පොල් සංවර්ධන අධිකාරියේ තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය මගින් නිකුත් කරනු ලබන පරීක්ෂණ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලැබෙන පරිදි හා පරීක්ෂණ කටයුතු නිවැරදිව, විධිමත්ව හා ක්‍රමානුකූලව සිදුකිරිම සඳහා, ISO 17025 තත්ව සහතිකය හා අදාල කාර්යයන් පවත්වා ගෙන යනු ලැබේ. පොල් තෙල් පරීක්ෂණ ක්‍රමවේදයන් සඳහා තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ රසායනික විශ්ලේෂණ අංශය විසින් ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් පිරිනමනු ලබන ISO 17025 තත්ව සහතිකය, හිමිකර ගන්නා ලදි. ඊට අදාල ප්‍රමිතින් පවත්වාගෙන යනු ලබන අතර, දිසිඳි පොල් හි ක්ෂුද්‍රජීවී පරීක්ෂණ සඳහා ISO 17025 තත්ව සහතිකය ලබා ගැනීමේ කාර්යයන් ආරම්භ කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් පොල් තෙල් පරීක්ෂණ සඳහා වසර 3කට පසුව සිදුකරනු ලබන නැවත තක්සේරුව (Re-assessment) හා ක්ෂුද්‍රජීවී රසායනාගාරයේ සැල්මොනෙල්ලා, සම්පූර්ණ සණාවාස සංඛ්‍යාව, දිලිර හා පුස් සංඛ්‍යාව, කොලිෆෝම් සංඛ්‍යාව, ඊ. කෝලයි සංඛ්‍යාව සඳහා ISO 17025 ප්‍රමිතිය ලබා ගැනීම සඳහා වූ මූලික තක්සේරු විගණන (Initial Assessment) කටයුතු 2014 වසරේ දෙසැම්බර් මස 16, 17 දිනයන්හිදි සිදුකර ඇත. ඒ අනුව 2014 වසර සඳහා 100%ක භෞතික ප්‍රගතියක් අත්කර ගෙන ඇත.



**B පුහුණු වැඩ සටහන් පැවැත්වීම**

තත්ව පාලන අංශයේ ආරම්භ කර ඇති ISO තත්ව සහතික ලබා ගැනීමේ කටයුතු සඳහා සහ කාලීනව සංශෝධනය කර ඇති පොල් නිෂ්පාදන පරීක්ෂා කිරීමේ ක්‍රමවේද සඳහා අවශ්‍ය වන පුහුණුව රසායනාගාරයේ සේවක පිරිස වෙනුවෙන් ලබාදී ඇති අතර වෙනත් බාහිර රසායනාගාරයන්හි සේවක පිරිස සඳහා තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් පුහුණු වැඩ සටහන් පවත්වා ඇත.

| | පුහුණු වැඩ සටහන | සහභාගී වූ සේවක සංඛ්‍යාව | පුහුණුව පැවැත්වූ ආයතනය |
|---|---|---|---|
| 1. | දිසිඳි පොල් මෝල්හි රසායානාගාර පරීක්ෂණ කටයුතු සිදුකරනු ලබන සේවක භවතුන් පුහුණු කිරීම | 03 | පොල් සංවර්ධන අධිකාරිය තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ රසායනාගාරය |
| 2. | ISO 9001,Sampling techniques | 02 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| 3. | අප ජලය පරීක්ෂා කිරීම | 02 | කාර්මික තාක්ෂණ ආයතනය |
| 4. | Training on ISO /IEC 17025: 2005 Development of Quality manual & Operating procedure for testing laboratory | 02 | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය |
| 5. | Training on proficiency testing/ inter laboratory comparison according to ISO /IEC 17043 | 02 | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය |
| 6. | ක්ෂුද්‍රජීවී හා රසායනික රසායනාගාර වල ආරක්ෂාව පිළිබඳ පාඨමාලාව | 03 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| 7. | රසායනාගාර කාර්යය මණ්ඩලය සඳහා ක්ෂුද්‍රජීවී පුහුණු වැඩ මුළුවක් | 18 (කණ්ඩාය ම 2) | කාර්මික තාක්ෂණ ආයතනය |

## Q4 අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්වය සුරක්ෂිත කිරීම

දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී හා භෞත රසායනික පරික්ෂා සිදුකිරීම, කර්මාන්ත ශාලා පරික්ෂා කිරීම සහ උපදේශක දායකත්වය සැපයීම. මේ යටතේ සිදුකරනු ලබන කාර්යයන් වේ.

දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි තත්ව ආරක්ෂණ කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම සඳහා, මාසයක කාලයක් තුල සියළුම දිසිදි පොල් මෝල් ආවරණය වන පරිදි, සකස් කර ගත් පූර්ව වැඩ සටහන් සැලැස්මකට අනුව ජංගම රසායනාගාරය යොදවා ඉහත කී සේවාවන් ක්‍රියාවට නැංවේ. පවතින සේවක සංඛ්‍යාව හා රජයේ අනුමත අතිකාල ආදී වූ ගෙවීම් සීමාව තුල රැදෙමින් රසායනාගාරයේ දෛනික පරික්ෂණ කටයුතු සඳහා අවහිරයක් නොවන පරිදි මෙම කර්තව්‍යයන් මනා සැලැස්මකින් යුතුව සිදුකරනු ලැබේ. 2013 වර්ෂය සඳහා ක්ෂේත්‍ර පරික්ෂා 405ක් සිදුකර ඇති අතර 2014 වර්ෂය තුල ක්ෂේත්‍ර පරික්ෂා 510ක් පැවැත්වීමට හැකියාව ලැබී ඇත. නිෂ්පාදන කරුවන්ගේ ඉල්ලීම මත පරික්ෂා කිරීම් වැඩිවී ඇති හෙයින් 2014 වසරේ ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 128%කි.

දිසිදි පොල් නිෂ්පාදන තත්වය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී පරික්ෂා සිදුකිරීම 2013 වර්ෂය සඳහා ආදර්ශ 269ක් වන අතර 2014 වර්ෂය සඳහා ආදර්ශ 476කි. මෙම ආදර්ශ 476 හි සිදුකර ඇති සම්පූර්ණ පරික්ෂණ සංඛ්‍යාව 1428 කි. 2014 වසරේදී ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 106%කි.

තවද දිසිදි පොල් නිෂ්පාදනයේදී භාවිතා කරනු ලබන ජලය නිසි ප්‍රමිතියෙහි පවතින්නේද යන්න පරික්ෂා කිරීම සඳහා එම ජලයේ ක්ෂුද්‍රජීවී, රසායනික හා බැරලෝහ විශ්ලේෂණය සිදුකරනු ලැබේ. ක්ෂුද්‍රජීවී හා රසායනික විශ්ලේෂණ ආදර්ශ 196ක් පරික්ෂා කර ඇති අතර බැරලෝහ විශ්ලේෂණය සඳහා ජල ආදර්ශ 89ක් පරික්ෂා කර ඇත. 2014 වසරේ ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 106%කි. මෙම ආදර්ශයන්හි බැර ලෝහ වර්ග 7 බැගින් පරික්ෂණ 623ක් සිදුකර ඇත.

## Q5. පොල් තෙල් කර්මාන්තය නඟාසිටුවීම

### A මිශ්‍ර පොල් තෙල් පිළිබඳ වෙළඳ පොල අධීක්ෂණ කටයුතු

ආහාරයක් වශයෙන් පොල් තෙල් වල ඇති සෞඛ්‍යාරක්ෂිත ගුණය පිළිබඳව හා එම නිෂ්පාදන ප්‍රමිතියානුකූලව නිපදවීම සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය මෙන්ම, තත්වය බාලවීමකින් තොරව වෙළඳපලට යොමු වීම, අරමුණුකර ගනිමින් තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් පරීක්ෂණ හා සමීක්ෂණ කාර්යයන් සිදුකර ඇත.

මිශ්‍ර පොල් තෙල් පිළිබඳ ලැබී ඇති විශ්ලේෂණ ප්‍රතිඵල සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පාරිභෝගික අධිකාරිය වෙත ලබාදී නීතිමය ක්‍රියාදාමයන් මගින්, පිරිසිදු පොල් තෙල් ලෙස මිශ්‍ර පොල් තෙල් වෙළඳාම සිදුකරන වෙළඳසැල් යම් පාලනයකට යටත් කිරීමට දායකවී ඇත.

දිවයිනේ දිස්ත්‍රික්කමය වශයෙන් වෙළඳපොලෙහි පවතින පොල් තෙල් ආදර්ශ රැස්කොට ඒවා මිශ්‍ර පොල් තෙල් වේ දැයි විමර්ශනය කිරීම සඳහා විශ්ලේෂණයන් නොකඩවා පැවැත්වීම 2014 වසරේද සිදුකර ඇති අතර කුඩා, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳසැල් සියල්ල ආවරණය වන පරිදි විධිමත්ව මෙම අධීක්ෂණ කටයුතු සිදුකර ඇත. එසේම පාරිභෝගික අධිකාරිය හා එක්ව වෙළඳපොල පොල් තෙල් ආදර්ශ රැස්කර එම ආදර්ශ පරීක්ෂා කර ප්‍රතිඵල ලබාදී ඉහත කී කාර්යය සඳහා දායකවී ඇත. 2014 වසරේදී ආදර්ශ 97ක් පරීක්ෂා කර, මිශ්‍ර පොල් තෙල් වාර්තාවීමේ ප්‍රතිශතය 72 % ක් ලෙස පැවති අතර 2013 වසරේදී සිදුකරනු ලැබූ මෙවැනි ආදර්ශ ප්‍රමාණයෙන් 51%ක ප්‍රතිශතයක් මිශ්‍ර පොල් තෙල් ලෙස වාර්තාවී ඇත. ඒ අනුව 2014 වසර තුල පොල් තෙල් මිශ්‍ර කිරීමෙහි වැඩි නැඹුරුවීමක් පෙනී යයි. පොල් තෙල් කර්මාන්තයේ පැවැත්ම සඳහාත්, පරිභෝගික ජනතාව කෙරෙහිත් මෙය අයහපත් තත්වයකි. පොල් තෙල් මිශ්‍ර කිරීමක් සිදු නොකලද, ප්‍රමිතිය හා එකඟ නොවූ පොල් තෙල් වෙළඳ සැල් ආශ්‍රිතව පවතින බව ප්‍රතිඵල අනුව වාර්තා වී ඇත._ඒ අනුව නිදහස් මේද අම්ල ප්‍රමාණය ප්‍රමිතිය හා එකඟ නොවීම මත 59% ක් ද, අයඩින් අගය එකඟ නොවීම මත 65%ක්ද ලෙස ගුණාත්මක භාවයෙන් අඩු පොල් තෙල් වෙළඳ පොලෙහි පවතින බව වාර්තාවී ඇත.

### B පොල් තෙල් කර්මාන්තයේ තත්වය වැඩි දියුණු කිරීම

පොල් තෙල් නිෂ්පාදනය ප්‍රමිතියානුකූල තත්වයට පත්කිරීම සඳහා පොල් තෙල් මෝල් ආශ්‍රිතව තත්ව පාලන වැඩ සටහන් ක්‍රියාවට නංවන ලදී. මේ අනුව පොල් තෙල් නිෂ්පාදනයේ අමුද්‍රව්‍යය වන කොප්පරා නිසි ප්‍රමිතියෙන් පවතිද යන්නත්, නිෂ්පාදනය කරනු ලබන පොල් තෙල් ගුණාත්මක තත්වයේ පවතිද යන්නත්, පොල් තෙල් නිස්සාරණය කාර්යක්ෂමව සිදුවේද යන්නත් අධ්‍යයනය කිරීම සඳහා පිළිවෙලින් කොප්පරා, පොල් තෙල් හා පුන්නක්කු ආදර්ශයන් පොල් තෙල් නිෂ්පාදනාගාර ආශ්‍රිතව රැස්කර පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් කර ඇත. මේ අනුව 2014 වර්ෂය සඳහා පොල් තෙල් ආදර්ශ 130ක්ද (පොල් තෙල් - 116, නැවුම් පොල් තෙල් - 10, කුරුටු පොල් තෙල් - 04), කොප්පරා ආදර්ශ 77ක්ද , පුන්නක්කු ආදර්ශ 78ක්ද

පරික්ෂා කර ඇති අතර 2014 ඉලක්කයට සාපේක්ෂව මෙකී සියළු පරීක්ෂණයන්හි ප්‍රගතිය 100%ක් ලෙස ලබා ඇත. ගාල්ල, මාතර, පුත්තලම, කුරුණෑගල, ගම්පහ, කොළඹ යන දිස්ත්‍රික්කයන් හි පිහිටි_පොල් තෙල් නිෂ්පාදනාගාරයන් මේ අනුව පරික්ෂා කර ඇති අතර, ප්‍රමිතිය හා එකඟ නොවු පොල් තෙල් 82 %, කොප්පරා 61 % ක් හා පුන්නක්කු 77 % ක් වාර්තා වී ඇත. ප්‍රමිතිය හා එකඟ නොවීම සම්බන්ධව සැකසුම් සංවර්ධන අංශය හරහා නිෂ්පාදන කරුවන් දැනුවත් කිරිමට කටයුතු කරනු ලැබේ.
මෙම ආදර්ශ ශ්‍රී ලංකා ප්‍රමිතිය හා එකඟ නොවීම,

පොල් තෙල් (ආදර්ශ - 116)

| පරාමිතිය | ප්‍රමිතිය හා එකඟ නොවු % | ප්‍රමිතියානුකුල නොවු ප්‍රතිඵල පරාසය | පොල් තෙල් සඳහා වු ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| වර්ණය | 17 % | 6-9 | 5 අවම |
| අයඩින් අගය | 22% | 11.1-27.1 | 7.5 – 11.0 |
| නිදහස් මේද අම්ල ප්‍රමාණය | 69% | 0.9-12.6 | 0.8 උපරිම |

නැවුම් පොල් තෙල් ( ආදර්ශ 10)

| පරාමිතිය | ප්‍රමිතිය හා එකඟ නොවු % | ප්‍රමිතියානුකුල නොවු ප්‍රතිඵල පරාසය | නැවුම් පොල් තෙල් සඳහා වු ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| වර්ණය | 0 | -- | 1 අවම |
| අයඩින් අගය | 0 | -- | 6 – 11.0 |
| නිදහස් මේද අම්ල ප්‍රමාණය | 10% | 0.3-0.5 | 0.2 උපරිම |

කුරුටු පොල් තෙල් (ආදර්ශ 4)

| පරාමිතිය | ප්‍රමිතිය හා එකඟ නොවූ % | ප්‍රමිතියානුකූල නොවූ ප්‍රතිඵල පරාසය | නැවුම් පොල් තෙල් සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|---|
| වර්ණය | 25% | 6-8 | 5 උපරිම |
| අයඩීන් අගය | 25% | 18.1 | 9.0 – 18.0 |
| නිදහස් මේද අම්ල ප්‍රමාණය | 75% | 0.9-3.1 | 0.8 උපරිම |

කොප්පරා - (ආදර්ශ 77)

| පරාමිතිය | ප්‍රමිතිය හා එකඟ නොවූ % | කොප්පරා සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|
| තෙල් ප්‍රමාණය | 61% | 68% අවම |

පුන්නක්කු (ආදර්ශ 78)

| පරාමිතිය | ප්‍රමිතිය හා එකඟ නොවූ % | පුන්නක්කු සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය |
|---|---|---|
| තෙල් ප්‍රමාණය | 77% | 5.0 – 8.0% |

## වෙනත් බාහිර ක්‍රියාකාරම්

පොල් නිෂ්පාදන ක්ෂේත්‍රය ප්‍රමුඛව, සෙසු පරික්ෂණ අවශ්‍යතා සඳහා පොල් සංවර්ධන අධිකාරියේ තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශයේ දායකත්වය පිළිබඳව ජනතා දැනුවත් කිරිම උදෙසා කුලියාපිටිය ප්‍රදේශයේ පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සඳහා 2014 වර්ෂයේදි සහභාගී වී ඇත.






2014 වසරේදි කුලියාපිටිය ප්‍රදේශයේ පැවැත්වු දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණයට පුර්ව ගාමීව පහත දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්හි පවතින වෙළඳසැල් හි මිශ්‍ර පොල් තෙල් අධික්ෂණ කටයුතු සිදුකර ඇත.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | රැස්කල මුළු ආදර්ශ ගණන | මිශ්‍ර පොල් තෙල් වාර්තාවීම | |
|---|---|---|---|---|
| | | | ගණන | % |
| පුත්තලම | වනාතවිල්ලුව, කරුවලගස්වැව, කල්පිටිය, පුත්තලම, නවගත්තේගම, මුන්දලම, ආනමඩුව, මහකුඹුකඩවල, පල්ලම, ආරච්චිකට්ටුව, මාදම්පේ, මහවැව, නාත්තන්ඩිය, වෙන්නප්පුව, දංකොටුව | 32 | 20 | 63 |
| කුරුණෑගල | ගීරිබාව, ගල්ගමුව, අඹන්පොල, කොටවෙහෙර, මහව, පොල්පිතිගම, නිකවැරටිය, පස්නායකපුර, කොබෙයිගනේ, වාරියපොල, ගනේවත්ත, ඉබ්බාගමුව, මාස්පොත, පඩුවස්නුවර, බිංගිරිය, | 60 | 43 | 72 |

| | | | | |
|---|---|---|---|---|
| | කටුපොත, බමුණාකොටුව, රිදිගම, කුරුණෑගල, මල්ලවපිටිය, කුලියාපිටිය, කුලියාපිටිය නැගෙනහිර, කුලියාපිටිය බටහිර, මාවතගම, ඉටුවැව, පොල්ගහවෙල, නාරම්මල, අලව්ව, උඩුබද්දාව, පන්නල | | | |
| කෑගල්ල | රඹුක්කන, මාවනැල්ල, වරකාපොල, ගල්ගමුව, කෑගල්ල, බුලත්කොහුපිටිය, අරනායක, රුවන්වැල්ල, යටියන්තොට, දෙහිඕවිට, දැරණියගල | 22 | 22 | 100 |

## 3. අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය

පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් අංශයක් ලෙස ක්‍රියාකරන අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, 2014 වසරේදී සිය සේවාදායකයින් වන පොල් අලෙවිකරුවන්/අපනයනකරුවන්, කර්මාන්තකරුවන් සහ අනෙකුත් සේවා අවශ්‍යතා සපුරාගන්නවුන් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර අදාල වසරේදී ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනයෙන් ලද ආදායමේ වැඩිවීම විශේෂ සිදුවීමක් ලෙස වාර්තාවන්ට ඇතුලත් විය. මෙම අපනයන ආදායම වාර්තාගත රු. බිලියන 72.87ක් ලෙස පෙන්නුම් කරන ලදි. පොල් අලෙවිකරුවන්ගේ සාර්ථකත්වය සඳහා බෙහෙවින් අවශ්‍යවන නිවැරදි අලෙවි තොරතුරු සහ දත්ත වාර්තා කිරීමෙහිලා අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය විසින් 2014 වසරේදී මහඟු කාර්යභාරයක් ඉටුකරන ලද අතර අපනයන ඉලක්කයන් ඉක්මවීම සඳහා මෙය වඩාත් ඉවහල් විය.

### 2014 වර්ෂය තුල ක්‍රියාත්මක සැලැස්මට අනුව ක්‍රියාත්මක කල ප්‍රධාන කාර්යයන්

- පොල් කර්මාන්ත ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම සහ පහසුකම් සැපයීම - අපනයනකරුවන්, වෙළඳුන්, පොල් වතු හා අතරමැදියන් ලියාපදිංචි කිරීම
- පොල් ආශ්‍රිත අපනයන හා ආනයන අධීක්ෂණ කටයුතු
- වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම
- ගෙඩි පොල් හා කොප්පරා වෙන්දේසි පැවැත්වීම
- පොල් වෙන්දේසිය අන්තර්ජාල ගත කිරීමට අදාල වැඩකටයුතු - මෘදුකාංග නිර්මාණ කටයුතු අවසන් අදියරේ පවතී. පොල් වෙන්දේසිය අන්තර්ජාලය හරහා පවත්වාගෙන යාම සම්බන්ධ නීති පද්ධතිය සකස් කර ඇත.
- දේශීය ප්‍රදර්ශන 11කට සහභාගීවීමෙන් පරිසර හිතකාමී පොල් ආශ්‍රිත කාර්මාන්ත පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
- කොහු හා වගාමාධ්‍ය පිළිබඳව ජර්මනියේ සහ රුසියාවේ පැවැති විදේශීය ප්‍රදර්ශන 02කට අපනයන ආයතන සහභාගී කරවීම, පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සඳහා ජපානයේ පැවති IFIA ප්‍රදර්ශනයට අපනයන ආයතන සහභාගී කරවීම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන බාධක ඉවත් කරගැනීම සඳහා ඉරාකයේ පැවති සාකච්ඡාව සඳහා සහභාගී වී ඇත.
- පොල් සහ තැඹිලි අපනයනයන් සඳහා අවසරපත් නිකුත් කිරීම සහ තාවකාලික අපනයනයන් සඳහා අවසරපත් නිකුත් කිරීම
- දිනපතා පොල් හා පොල් ආශ්‍රිත වෙළඳපල මිල ගණන් පුවත්පත් සඳහා ලබාදීම
- පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණ, අපනයන/ආනයන ප්‍රමාණ, වෙන්දේසි මිල ගණන්, ලෝක වෙළඳපල මිල ගණන් අඩංගු සති වාර්තා, මාසික වාර්තා සහ 2013 වසර සඳහා ශ්‍රී ලංකා පොල් සංඛ්‍යාති වාර්තාව නිකුත් කර ඇත.
- අගය වැඩි කළ පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල පිළිබඳව ව්‍යාවසායකයින් දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම සහ ඒවාට සම්බන්ධ වීම

- පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ට සහය වීම සඳහා අතුරු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ඒකකයක් පිහිටුවීම සඳහා කැබිනට් පත්‍රිකාව නිකුත් කර ඇති අතර කොහු ආශ්‍රිත නිෂ්පාදන ආයතන වල ධාරිතාවය සහ අනෙකුත් අවශ්‍ය දත්ත රැස්කරන ලද අතර රාජ්‍ය ආයතන වලට අවශ්‍යවන පොල් ආශ්‍රිත නිෂ්පාදන පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලබාදීමට කටයුතු සකස් කිරීම.
- වාණිජ දෙපාර්තමේන්තු සමග චීනය,ඊජිප්තුව, බෙලරුස්,කොරියාව, කෙන්යාව, ඇමරිකා එක්සත් ජනපදය සහ තුර්කිය යන රටවලට අදාලව වෙළඳ ගිවිසුම් සඳහා සාකච්ඡා වලට සහභාගී වීම සහ අවශ්‍ය තොරතුරු ලබාදීම
- ශ්‍රී ලංකාවේ පොල් වගා බිම් ප්‍රමාණය සහ පොල් ගස් ගණන GIS තාක්ෂණය මගින් ගණනය කිරීමේ කටයුතු කොළඹ විශ්ව විද්‍යාලය සමග කරගෙන යාම
- දේශීය වෙළඳපල තුල පොල් අලෙවිය සිදුවන ආකාරය පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් කොළඹ විශ්ව විද්‍යාලය සමග සිදුකරගෙන යාම
- පොල් වතුර, පොල් ලෙලි, සක්‍රීය කාබන් පිළිබඳව සමීක්ෂණ කටයුතු කරගෙන යාම
- ගෘහස්ථ පොල් පරිභෝජනයේදී සිදුවන නාස්තිය අවම කිරීම සහ අගය වැඩිකළ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ජනතාව අතර ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමග කරගෙන යාම
- පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන කරුවන් සඳහා විදේශීය වෙළඳ විමසුම් ලබාදීම
- පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනය කිරීමේදී ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා "CEYLON COCONUT" යන සන්නාම නාමය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම
- පිරිසිදු පොල් තෙල් අලෙවියේදී සිදුවන කලවම් කිරීම් අවම කිරීම සඳහා පාරිභෝගික අධිකාරිය සමග සාකච්ඡා පැවැත්වීම

අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය මගින් 2014 වසරේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් එහි ප්‍රගතියද සහිතව පහත පරිදි වේ.

## 3.1 නිෂ්පාදකයින්ගේ හා අනාගත ගැණුම්කරුවන්ගේ ජාලයක් ඇතිකිරීම

### 3.1.1 පොල් හා පොල් ආශ්‍රිත නිම් භාණ්ඩ අලෙවිකරණ සම්බන්ධ සියල්ලන් හා පොල් වතු ලියාපදිංචිය

2013 වසරට සාපේක්ෂව 2014 වසරේදී පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙහි අපනයනයන්හි නියැලෙන අපනයනකරුවන්ගේ ලියාපදිංචිය 12%කින් ඉහල නැංවීමට හැකිවූ අතර පොල් හා කොප්පරා සම්බන්ධ වෙළෙඳුන් සහ පොල් වතු ලියාපදිංචිකිරීමේ කටයුතුද 2013 වසරට සාපේක්ෂව ඉහල අගයක් ගෙන තිබුනි.

2013 සහ 2014 වසර සඳහා පහත සඳහන් අයුරු ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකරන ලදි.

| | 2014 | 2013 |
|---|---|---|
| අපනයන කරුවන් | 612 | 548 |
| බ්‍රෝකර්වරුන් | 21 | 21 |
| වෙළඳුන් | 86 | 39 |
| පොල් වතු | 189 | 178 |

### 3.1.2 පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වෙන්දේසි පැවැත්වීම

#### 3.1.2.1 කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

පොල් සංවර්ධන අධිකාරිය විසින් 1994 වසරේදී ආරම්භ කරන ලද පොල් වෙන්දේසිය 2014 වසරේදිද වෙන්දේසි 48ක් පවත්වා පොල් වගා කරුවන්ට තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාගැනීමට අවස්ථාව ලබාදී ඇත.

නිරන්තරයෙන් උච්චාවචනයන්ට භාජනය වන පොල් මිලෙහි ස්ථායිභාවය රැකගැනීමට සතිපතා පැවැත්වූ පොල් වෙන්දේසියෙහි මිල ගණන් තීරක මෙහෙයක් ඉටුකරන ලද අතර පොල් වෙන්දේසියෙහි ඵලදායිතාවය වැඩිකරලීමට අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2014 වසරේදී ප්‍රමුඛතාවයක් ලබාදී කටයුතු කරන ලදි.

2014 වසරේදී වෙන්දේසිය සඳහා පොල් ගෙඩි 71,505,228ක ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබූ අතර එය 2013 වසරට සාපේක්ෂව 54% ක වැඩිවීමකි. ගෙඩි පොල් වෙන්දේසියේ ප්‍රගතිය පහත පරිදි විය.

| වර්ෂය | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කල ප්‍රමාණය | විකුණූ ප්‍රමාණය | |
| 2014 | 71,505,228 | 43,153,617 | 32,301.76 |
| 2013 | 46,294,855 | 34,194,972 | 33,041.92 |

අවශ්‍ය ඕනෑම අයෙකුට පොල් වෙන්දේසියට සහභාගීවීමට හැකි වන ආකාරයට ගෙඩි පොල් වෙන්දේසිය අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අවසන් අදිරයේ පවති. එය 2015 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

### 3.1.2.2 ප්‍රාදේශීය ගෙඩි පොල් වෙන්දේසිය

කුඩා සහ මධ්‍යම පොල් වගාකරුවන්ට තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාගැනීමට හැකිවන ආකාරයට ආරම්භ කරන ලද ප්‍රාදේශීය පොල් වෙන්දේසිය 2014 වසරේදී මසකට වරක් බැගින් අවස්ථා 12කදී කුලියාපිටියේදී පවත්වන ලද අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

| වර්ෂය | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කල ප්‍රමාණය | විකුණු ප්‍රමාණය | |
| 2014 | 747,600 | 619,600 | 33,763.69 |
| 2013 | 951,810 | 763,702 | 31,112.30 |

### 3.1.2.3 කොප්පරා වෙන්දේසිය

2014 වසර සඳහා ඉලක්කගත ප්‍රමාණයට කොප්පරා වෙන්දේසිය පැවැත්වීමට නොහැකි වුවද 2013 වසරට සාපේක්ෂව 2014 වසරේදී කොප්පරා වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලද කොප්පරා ප්‍රමාණයේ වැඩිවීමක් පෙන්නුම් කරන ලදි.

2014 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් කොප්පරා වෙන්දේසි 38ක් පවත්වන ලද අතර කොප්පරා වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර තිබූ කොප්පරා ප්‍රමාණයන් පහත දැක්වේ.

| වර්ෂය | ඉදිරිපත් කල ප්‍රමාණය (කි.ග්‍රෑ.) | විකුණු ප්‍රමාණය (කි.ග්‍රෑ.) | සාමාන්‍ය මිල ගණන් (රු.කි.ග්‍රෑ 250 පාරමක් සඳහා) | |
|---|---|---|---|---|
| | | | විශිෂ්ඨ අංක 1 | විශිෂ්ඨ අංක 2 සහ 3 |
| 2014 | 552,172 | 525,931 | 43,406 | 38,815 |
| 2013 | 437,942 | 435,380 | 37,520 | 35,913 |

### 3.1.2.4 වෙළඳ ආරවුල් සම්බන්ධ කටයුතු

අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ මූලිකත්වයෙන් පවත්වන ලද පොල් හා කොප්පරා වෙන්දේසිවල ඇති වන වෙළඳ ආරවුල් සමථයකට පත්කිරීම සඳහා වැඩි කාර්යය භාරයක් ඉටුකරන ලද අතර පොල් හා පොල් නිෂ්පාදන අපනයන අවස්ථාවලදීද ඇතිවන වෙළඳ ආරවුල් සමථයකට පත්කිරීම සඳහාද අනගි දායකත්වයක් මෙම අංශය විසින් ලබා දී තිබේ.

### 3.1.3 පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් අලෙවි මාර්ග සංවිධානය කිරීම

#### 3.1.3.1 දේශීය වෙළඳ ප්‍රදර්ශන

2014 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් පහත සඳහන් දේශීය වෙළඳ ප්‍රදර්ශණ 11කට සහභාගී වී පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ පොල් ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ නිෂ්පාදන හා අපනයන තොරතුරු පාසැල් සිසුන් සහ මහජනතාව අතර ප්‍රචලිත කිරීම සිදුකරන ලදි.

| | ප්‍රදර්ශනයේ නම | ස්ථානය | සංවිධානය |
|---|---|---|---|
| 1. | දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණය | කුලියාපිටිය | තොරතුරු තාක්ෂණ හා විදුලි සංදේශ අමාත්‍යාංශය |
| 2. | සීතාවක අභිමන් | පාදුක්ක පියරතන විද්‍යාලය | සීතාවක උරුමය පදනම |
| 3. | බිංගිරිය මල් වසන්තය | බිංගිරිය | බිංගිරිය සංවර්ධන පදනම |
| 4. | කෘෂිකර්ම හා කර්මාන්ත ප්‍රදර්ශනය | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ශාලාව | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය |
| 5 | බොදුබල සේනා | කිරුළපන | බොදුබල සේනාව |
| 6 | අවුරුදු පොළ | බත්තරමුල්ල | සුබසාධක සංගමය,නාගරික සංවර්ධන අධිකාරිය |
| 7 | ජාතික කෘෂිකර්ම සතිය | තෙලිජ්ජවෙල | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 8 | ලෝක සංචාරක දිනය | ආරුගම්බේ | සංචාරක කර්මාන්ත මණ්ඩලය |
| 9 | Food & Flora 2014 | නාවල | විවෘත විශ්වවිද්‍යාලය |
| 10 | Cocotech ජාත්‍යන්තර ප්‍රදර්ශනය | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ශාලාව | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය |
| 11 | 'ඇග්බිස්' | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ශාලාව | ජාතික කෘෂිකර්ම සභාව |

#### 3.1.3.2 විදේශීය වෙළඳ ප්‍රදර්ශන

අගය වැඩි කරන ලද පොල් ආශ්‍රිත භාණ්ඩ සඳහා වැඩි විදේශ විනිමයක් ලබාගැනීමේ අරමුණෙන් විදේශීය වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී වීම සහ අපනයන කරුවන් ඒ සඳහා සහභාගී කරවීම පොල් සංවර්ධන අධිකාරිය විසින් සෑම වසරකම සිදු කරනු ලැබේ. මෙසේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී වීමෙන් විදේශ ඇණවුම් වැඩි වශයෙන් ලබාගැනීමටත්, තරගකාරී භාණ්ඩයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් දිනෙන් දින යාවත්කාලීන වන භාණ්ඩයන්ගේ ප්‍රමිතීන් පිළිබඳව දැනුවත්වීමටත් හැකියාව ලැබේ. ජාත්‍යන්තර වෙළඳපල ප්‍රදර්ශන සඳහා නිෂ්පාදන/අපනයනකරුවන් සහභාගී කරවීමෙන් ශ්‍රී ලංකාව සඳහා වූ විදේශ වෙළඳපල තවදුරටත් පුළුල් වන අතර පොල් කර්මාන්තයේ අපනයන ආදායම වසරින් වසර ඉහල නැංවීමට හැකියාව ලැබීමෙන් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාව ලැබේ.

**2014 වසරේදී ද පොල් සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් ජාත්‍යන්තර ප්‍රදර්ශන වලට සහභාගී විය.**

1. උද්‍යාන සහ ගෙවතු අලංකරණය සඳහා ජර්මනියේ පැවැත්වූ IPM ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය- මෙම ප්‍රදර්ශනය සඳහා 2014 වසරේදී පොල් සංවර්ධන අධිකාරියේ බැනරය යටතේ අපනයනකරුවන් 04 දෙනෙකු සහභාගී කරවූ අතර, පොල් කෙඳි ආශ්‍රිත අගය වැඩිකල නිෂ්පාදනයන් වන කොහු බත් මගින් නිෂ්පාදනය කරන භාණ්ඩ, මිහිසළු, කොහු මල් පොච්චි, බුරුසු, වගාමළු යනාදිය වෙනුවෙන් ගැණුම්කරුවන් සොයාගැනීමට වැඩි ඉඩකඩක් පැවතුනි.




මෙම ගැණුම්කරුවන් සමග සෘජු සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් දීර්ඝ කාලීන ප්‍රතිලාභ ලබාගත හැකිවනු ඇත. මෙම ප්‍රදර්ශනයට සහභාගී වීමෙන් පසුව ශ්‍රී ලාංකීය අපනයනකරුවන් වෙත රු.මිලියන 62ක ඇණවුම් ලැබී ඇති බව පොල් සංවර්ධන අධිකාරිය වෙත ඔවුන් විසින් වාර්තා කර ඇත.

2. ආහාර හා පාන වර්ග පිළිබඳව ජපානයේ ටෝකියෝ නගරයේදී වෙළඳ හා පාරිභෝගික ප්‍රජාව ඉලක්ක කර ගනිමින් පැවැත්වෙන ප්‍රධාන පෙලේ වෙළඳ ප්‍රදර්ශනයක් වන IFIA ප්‍රදර්ශනය සඳහා ප්‍රථම වතාවට පොල් සංවර්ධන අධිකාරිය අපනයන/කර්මාන්තකරුවන් තිදෙනෙකු සහභාගී කරවීමට කටයුතු යොදන ලදී.




පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ජපාන වෙළඳපලතුල බහුලව දක්නට නොලැබෙන අතර මෙහිදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන වන නැවුම් පොල් තෙල්, පොල් කිරි, පොල් කිරි පිටි, පොල් වතුර, තැඹිලි යනාදිය වෙනුවෙන් ගැණුම්කරුවන් සොයාගැනීමට අවස්ථාවක් උදාවුනි. මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගීවූ අපනයනකරුවන් දැනට රු.මිලියන 7.8 පමණ ඇණවුම් ලබාගෙන ඇති අතර ජපාන ආනයනකරුවන් මෙම නිෂ්පාදන සඳහා ඉහල ප්‍රමිතියක් බලාපොරොත්තු වන බැවින් ඔවුන් කිපදෙනෙක් ශ්‍රී ලංකාවට පැමිණ අපනයන කරුවන්ගේ භාණ්ඩ පිළිබඳ ප්‍රමිතිය පරීක්ෂා කර තිබේ.



3. ලෝකයේ ප්‍රමුඛතම හරිත ප්‍රදර්ශනයක් ලෙස සැලකෙන IPM ප්‍රදර්ශන මාලාවේ රුසියාවේදී පවත්වන ලද IPM ප්‍රදර්ශනයට පොල් සංවර්ධන අධිකාරිය විසින් 2014 වසරේදී අපනයනකරුවන් 05 දෙනෙකු සහභාගී කරවිය. රුසියාවේදී පවත්වන ලද වෙළඳ ප්‍රදර්ශනයකට පොල් සංවර්ධන අධිකාරිය විසින් අපනයනකරුවන් ප්‍රථම වතාවට සහභාගී කරවූ අතර එහිදී රුසියානු ආනයනකරුවන් වෙත ශ්‍රී ලාංකිය නිෂ්පාදන පිළිබඳව දැනුවත් කිරීම් කරන ලද අතර ඉදිරියේදී රුසියාව ඇතුළු නැගෙනහිර යුරෝපීය රටවලට පොල් ආශ්‍රිත අගය වැඩිකල භාණ්ඩ වැඩි ප්‍රමාණයක් අපනයනය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

4. පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඇති අපනයන බාධක ඉවත් කරගැනීම සඳහා ඉරාකයේ පැවති සාකච්ඡාවට සහභාගී වීමෙන් පොල් සංවර්ධන අධිකාරියේ සහය ලබාදෙන ලදී.

5. ජෙරුසලමේ පැවති ART & CRAFT ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකීය පොල් නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී.

6. පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ තවත් තරඟකාරී රටක් වශයෙන් සැලකෙන බ්‍රසීලයේ ක්‍රමාණුකූලව පවත්වාගෙන යනු ලබන පොල් වගාවන් පිළිබඳව අධ්‍යයනය කිරීමටත් පොල් කර්මාන්ත ක්ෂේත්‍ර හා සම්බන්ධ ආයතන නිරීක්ෂණය කිරීමත් පොල් සංවර්ධන අධිකාරිය මඟින් 2014 වසරේදී සිදුකරන ලදී. මෙමගින් ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ කර්මාන්ත කරුවන්ට අවබෝධයක් ලබාදීමට හැකියාව ලැබෙනු ඇත.

### 3.1.4 දේශීය හා ජාත්‍යන්තරව පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම හා පාලනය කිරීම

2014 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් ගෙඩි පොල්, තැඹිලි සහ පොල් කොළ ආශ්‍රිත විසිතුරු භාණ්ඩ අපනයන සඳහා තාවකාලික අවසර පත් 5200ක් අදාල අපනයන කරුවන් වෙත නිකුත් කර ඇත.

අධිකාරියේ වෙබ් අඩවිය මඟින්, සඟරා සහ වෙනත් විදේශීය ආයතන සහ ආනයන කරුවන් විසින් අධිකාරිය වෙත ලැබෙන පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ වෙළඳ ඇණවුම් පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති අපනයන/කර්මාන්ත කරුවන් වෙත ලබාදීම 2014 වසරේදීද සිදුකෙරිනි.

### 3.1.5 පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ නිෂ්පාදනයන්, වෙළඳාම සහ අපනයන සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලි සියල්ලන්ට සිය වෙළඳතීරණ ගැනීමේදී තීරණාත්මක සාධකයක් වනුයේ නිවැරදි තොරතුරු ලබාගෙන ඒවා විශ්ලේෂණය කිරීමය. මෙහිදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ තොරතුරු සේවාව 2014 වසරේදී විශේෂ කාර්යයභාරයක් පහත දක්වා ඇති අංග තුලින් ඉටුකරන ලදී.

- පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන තොරතුරු, අපනයන සහ ආනයන දත්ත ලබාගැනීම හා අදාල පාර්ශවකරුවන් වෙත බෙදාහැරීම
- ගොවිපල මිල ගණන් සම්බන්ධයෙන් අදාළ තොරතුරු සහ දත්ත විධිමත්ව රැස්කිරීම හා බෙදාහැරීම
- ගෘහස්ත පොල් හා පොල් තෙල් පරිභෝජනය පිළිබඳව දත්ත විධිමත්ව රැස්කිරීම, සසඳා බැලීම
- නවතම අලෙවි ක්‍රම හඳුන්වාදීම මඟින් අපනයන ආදායම වැඩිකර ගැනීමට සහය වීම
- වර්තමාන හා අපේක්ෂිත පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳව තොරතුරු විධිමත්ව රැස්කිරීම, සටහන් කිරීම හා ප්‍රචාරණය කිරීම

පහත සඳහන් ආයතන මෙම තොරතුරු බෙදාහැරීමේ කර්තව්‍ය සඳහා සිය දායකත්වය නොමසුරුව ලබාදෙන ලදි.

- ශ්‍රී ලංකා රේගුව
- ශ්‍රී ලංකා මහ බැංකුව
- අපනයන සංවර්ධන මණ්ඩලය
- ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව
- කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතන

- තවද විදේශීය ආයතන වන ආසියානු පැසිපික් පොල් ප්‍රජාව, විදේශ සඟරා (Cocommunity, Oil World, UCAP, Indian Coconut Journal) ආදියෙන්ද පොල් කර්මාන්තය සඳහා ලබාගන්නා විශේෂිත තොරතුරු නිරතුරුවම ශ්‍රී ලංකා පොල් ප්‍රජාවට ලබාදීමේ කාර්යභාරය 2014වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණඅංශය මඟින් සාර්ථකව ඉටුකරන ලදි.

- පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වල දේශීය මිල ගණන් ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයෙන් දිනපතා පුවත්පත් මඟින් 2014 වසරේදීද ප්‍රකාශයට පත් කරන ලදි.

- පොල් හා කෝප්පරා වෙන්දේසි මිලගණන්, දේශීය පොල් ආශ්‍රිත භාණ්ඩ සඳහා වන ගොවිපල මිල ගණන්, තොග මිල ගණන් හා ජාත්‍යන්තර මිල ගණන් ඇතුලත් "Coco Market Focus" සති වාර්තාවේ ප්‍රකාශන 48ක් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් 2014 වසරේදී ප්‍රකාශයට පත්කරන ලදි.




- පොල් හා පොල් ආශ්‍රිත සියලුම භාණ්ඩයන්ගේ අපනයන ප්‍රමාණයන්, මිලගණන්, අපනයනය කරන ලබනු රටවල් සහ ආනයනය කරනු ලබන බාද්‍ය තෙල්, පොල් තෙල් ආනයන ප්‍රමාණයන් සහ මිලගණන් ඇතුලත් "Coco Market Focus" මාසික සඟරාවේ ප්‍රකාශන 12ක් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ පාර්ශව කරුවන්ගේ අවශ්‍යතාවයන්ට අනුව සම්පාදනය කොට 2014 වසරේදී ප්‍රකාශයට පත්කරන ලදි.






- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කරන හරවත් ප්‍රකාශනයක් වන Sri Lanka Coconut Statistics ප්‍රකාශනය 2014 වසරේදීද සම්පාදනය කොට ඉදිරිපත් කරන ලදි. එම ප්‍රකාශනයේ ඇතුලත් දත්තයන් අතර ශ්‍රී ලංකාවෙන් අපනයන කරන ලද සියලුම පොල් ආශ්‍රිත භාණ්ඩ වල අපනයන ප්‍රමාණ හා මිල ගණන්, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබු පොල් තෙල් සහ අනෙකුත් ඛාද්‍ය තෙල් වර්ග වල ප්‍රමාණ හා මිලගණන්, අන්තර්ජාතික පොල් ඵලදාව, නිෂ්පාදන සහ අපනයන තොරතුරු, අපනයන/කර්මාන්ත කරුවන්ගේ තොරතුරු විශේෂයෙන් සඳහන් කල හැක. මෙම ප්‍රකාශනය සඳහා ශ්‍රී ලංකාව තුලත් විදේශයන්හිත් මනා ඉල්ලුමක් පවතී.

- මීට අමතරව අමාත්‍යාංශය විසින් සෑම මසකම නිකුත් කරන ලද කප්රුක පුවත්පත සඳහාද පොල් කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම උදෙසා තොරතුරු ලබාදීමද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් සිදුකරන ලදි.

## 3.2 නව නිෂ්පාදන, අගය එකතු කිරීම්, වෙළඳපල ප්‍රවර්ධනය හඳුන්වාදීම සහ වෙළඳපල ප්‍රවිෂ්ඨය වැඩිකිරීම

**3.2.1** පොල් කටු හා කෙඳි ආශ්‍රිත අගය වැඩි කළ විසිතුරු භාණ්ඩ නිෂ්පාදන කරුවන්ගේ නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳපලේ ඉල්ලුමට සරිලන ආකාරයට සකස් කර ඔවුන්ට වෙළඳපලක් සොයාදීමට ජාතික ශිල්පසභාව, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා අංශය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ එක්ව කටයුතු සිදු කරමින් පවතී.

**3.2.2** කර්මාන්තකරුවන්ට සහය වීම සඳහා අතුරු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ රාජ්‍ය ආයතන වලට අවශ්‍ය කරන පොල් ආශ්‍රිත භාණ්ඩ පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති කර්මාන්තකරුවන් ගෙන් මිලදී ගැනීමට සහයවීමට කටයුතු සිදුකරමින් පවතී.

**3.2.3** ශ්‍රී ලංකාවේ පොල් වගා බිම් ප්‍රමාණය සහ පොල් ගස් ගණන් ඉතාමත්ම අවශ්‍ය සාධකයක් බැවින් එය GIS තාක්ෂණය මගින් ගණනය කිරීමට කොළඹ විශ්ව විද්‍යාලය සමඟ සහයෝගිතා ගිවිසුමක් අත්සන් කර ගණනය කිරීම සිදුකරමින් පවතී.

**3.2.4** දේශීය වෙළඳපල තුල පොල් අලෙවිය සිදුවන ආකාරය පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් කොළඹ විශ්ව විද්‍යාලය සමඟ සිදුකරන ලදි.

**3.2.5** දේශීය හා විදේශීය පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ භාවිතයන් හඳුනාගැනීම සඳහා අලෙවි සමීක්ෂණ පැවැත්වීම

2014 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් පහත දක්වා ඇති ක්ෂේත්‍රයන්හි සමීක්ෂණ සිදුකරන ලදි.

- පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ දත්තයන්
- දේශීය වෙළඳ පොල මිල ගණන් හැසිරුණු ආකාරය
- පොල් තෙල් සහ අනෙකුත් ආදේශක තෙල් පරිභෝජනය
- ගෙඩි පොල් වෙනුවට අගය එකතු කල ආදේශක භාවිතය
- පොල් කටු අපතේ යාම පිළිබද සමීක්ෂණ කටයුතු
- පොල් මද ආශ්‍රිත කර්මාන්ත වලදී දෛනිකව එක්රැස්වන පොල් වතුර ප්‍රමාණය
- පොල් ත්‍රිකෝණයෙන් පිට පොල් ලෙලි එක්රැස්වීම පිළිබදව සහ කර්මාන්තයට උපයෝගී වන ආකාරයෙන් පොල් ත්‍රිකෝණයෙන් එපිට පොල් කෙඳි වගා මාධ්‍ය ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම සදහා යෙදවිය හැකි ආකාරය
- සක්‍රිය කාබන් නිෂ්පාදනකරුවන්/අපනයනකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ කර්මාන්ත වල නිෂ්පාදන ධාරිතාවය,දැනට කර්මාන්තය තුල ඇති අපහසුතාවයන්
- පාරිභෝගික අවශ්‍යතාවයන් වෙනස්වන ආකාරය

ඉහත දක්වා ඇති සමීක්ෂණ තුලින් පහත දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම අපේක්ෂා කෙරිනි.

- රටතුල විසිරී සිටින පොල් ආශ්‍රිත නිෂ්පාදකයින් හදුනාගැනීම
- පොල් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රමාණයන් පිළිබදව තොරතුරු එක්රැස්කිරීම
- පොල් මද ආශ්‍රිත නිෂ්පාදන - විශේෂයෙන් පොල් තෙල්, සහ පොල් වතුර කර්මාන්තයන්හි නිෂ්පාදන ධාරිතාව පිළිබඳ තොරතුරු ලබාගැනීම
- නිෂ්පාදන පිරිවැය තොරතුරු එක් එක් පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා එක්රැස් කිරීම සහ එහි වෙනස් වීම් හඳුනාගැනීම. එතුලින් ඉදිරි වර්ෂයේ නිෂ්පාදන රටාවන් පිළිබඳ අවබෝධයන් ලබාගැනීමට හැකියාව ලැබුණි. ඒක පුද්ගල ගෙඩි පොල් පරිභෝජනය පිළිබඳ තොරතුරු රැස්කිරීම සහ එතුලින් ඉදිරි වර්ෂය සඳහා ගෙඩි පොල් අවශ්‍යතාවය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
- දේශීය පොල් තෙල් නිෂ්පාදනය පිළිබඳ ඉල්ලුම් සහ සැපයුම් තත්ත්ව හඳුනාගැනීම සහ එමඟින් ඉදිරි වසරේ දේශීය පොල් තෙල් අවශ්‍යතාවය සපුරාලීමට ගතයුතු ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති සැලසුම්කිරීම

## 3.3 ගෘහස්ත පොල් භාවිතයේදී වන අපතේ යාම අවම කිරීම සඳහා පොල් මද ආශ්‍රිත නව නිෂ්පාදන හඳුන්වාදීම

- පොල් භාවිතයේදී සිදුවන නාස්තිය අවම කිරීමට පොල් කිරි, පොල් කිරිපිටි හා පොල් ක්‍රීම් භාවිතය පිළිබදව ජනතාව දැනුවත් කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය සහභාගී වූ දේශීය ප්‍රදර්ශන වලදී ප්‍රායෝගික වැඩසටහන්ද සහිතව ඉතා වටිනා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර නාස්තිය අවම කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන සදහා ඉතාමත් ඉහල ජනතා ප්‍රතිචාර ලැබුණි.



- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා රූපවාහිනී සංස්ථාව මගින් ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ප්‍රචාරණය කරන ලදි. මෙම වැඩසටහන් 2015 වසරේදීද ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- පොල් භාවිතයේදී අපතේ යාම අවම කිරීමට උපායමාර්ගික පොල් මද නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරන ලදි.

## 3.4 පොල් ආශ්‍රිත නිෂ්පාදනවල පෝෂණාත්මක හා ඖෂධීය ලක්ෂණයන්හි ගුණාත්මකභාවය මාධ්‍ය හරහා දැනුවත්වීම වැඩිකිරීම

- නව තාක්ෂණයට පිවිසුමක් ලෙස පොල් සංවර්ධන අධිකාරිය මගින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු 2014 වසරේ අවසාන කාර්තුවේදී ආරම්භ කර ඇති අතර ඉදිරියේදී වඩාත් පහසු ලෙස විදේශීය ආයතන සමග තොරතුරු හුවමාරු කරගැනීමටත් නිරතුරු සම්බන්ධතාවයන් ගොඩනගාගැනීමටත් හැකියාව ලැබෙනු ඇත.

- පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනයේදී ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීමට "Ceylon Coconut"යන සන්නාම නාමය යොදාගැනීම සඳහා අවශ්‍ය ලාංඡනය නිර්මාණය කර ඇති අතර එය භාවිතා කිරීමට අවශ්‍ය අනුමැතියට ඉදිරිපත් කර තිබේ.

CEYLON COCONUT
The Mark of Quality

## 3.5 ලපටි පොල් වතුර අපනයන වැඩිකිරීමට පොල් බීම නිෂ්පාදන සඳහා තැඹිලි හා වෙනත් කුන්දිරි වර්ග ප්‍රවර්ධනය

2013 වසරට සාපේක්ෂව 2014 වසරේදී නව ගැණුම්කරුවන් හඳුනාගැනීම හේතුවෙන් තැඹිලි අපනයනය 247%ක් වර්ධනය පෙන්නුම් කර තිබේ. පොල් වතුර අපනයනය සඳහා යොමුවී ඇති ආයතන ගණනාවක් 2014 වසරේදී තම නිෂ්පාදන විදේශීය වෙළඳපලට නිකුත් කර ඇති අතර ඒ සඳහා විදේශීය වෙළඳපලේ ඉහළ ඉල්ලුමක් 2015 වසරේදීද බලාපොරොත්තු විය හැකිය.

පරිසර හිතකාමී පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ භාවිතය පිළිබඳව ශ්‍රී ලාංකික ජනතාව දැනුවත් කිරීමේ අරමුණෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් ඔස්සේ ප්‍රවර්ධන සේවාවන් 2014වසරේදීද ඉදිරිපත් කරන ලදි.

## 3.6 අලෙවි සංවර්ධන සහාය සේවා

- නිෂ්පාදන / වෙළඳපොලවල් හා විවිධ සේවාවන් පිළිබඳව උපදේශක සේවාවන් ලබාදීම
- පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල නිෂ්පාදන සඳහා පුරෝකථනයන් සැකසීම සඳහා අමාත්‍යාංශයට සහයෝගය දැක්වීම
- දේශීය හා ජාත්‍යන්තර වෙලඳ ඇණවුම් පිළිබද තොරතුරු සැපයීම

## 3.7 අපනයන ඉපැයීම්

පොල් නිෂ්පාදිත අපනයන ආදායම (2005 – 2014)

| වසර | වටිනාකම (රු. මිලියන) |
|---|---|
| 2005 | 17,520 |
| 2006 | 19,661 |
| 2007 | 24,096 |
| 2008 | 28,094 |
| 2009 | 29,081 |
| 2010 | 32,433 |
| 2011 | 47,306 |
| 2012 | 46,666 |
| 2013 | 47,952 |
| 2014 | 72,867 |




පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් මෙතෙක් ලබා ඇති ඉහලම වාර්තාගත ආදායම 2014 වසරේදී ලබාගෙන ඇති අතර එය රුපියල් බිලියන 72.87ක් වේ. එය 2013 වසරට සාපේක්ෂව 52%ක වැඩිවීමකි.

2014 වසරේදී පොල් මද නිෂ්පාදන, පොල් කටු නිෂ්පාදන, පොල් කෙඳි නිෂ්පාදන, අගය වැඩි කල පොල් කොහු නිෂ්පාදන සහ අනෙකුත් පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා 2013 වසරට සාපේක්ෂව ඉහල අපනයන ආදායමක් ලබාගෙන තිබේ.

2014 වසරේ පොල් මද නිෂ්පාදන අපනයන ආදායම රු. බිලියන 37ක් වේ. එය 2013 වසරට සාපේක්ෂව 111%ක වැඩිවීමකි. 2014 වසරේදී නැවුම් පොල් තෙල් අපනයනය කිරීමෙන් 2013 වසරට සාපේක්ෂව 267% ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

පසුගිය වසරට සාපේක්ෂව මෙවර කොහු අපනයනයේ පසුබෑමක් දක්නට තිබේ. පොල් සංවර්ධන අධිකාරියේ අභිප්‍රාය වනුයේ අපනයන කරුවන් අගය වැඩි කරන ලද පොල් කෙඳි නිමි භාණ්ඩ අපනයන කිරීමත් එමගින් වැඩිපුර විදේශ විනිමය උපයාගැනීමත්ය.

පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙන් 2013 වසරට සාපේක්ෂව 2014 වසරේදී 10%ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

අගය වැඩි කල කොහු ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් 2013 වසරට සාපේක්ෂව 16%ක් වැඩිවීමක් 2014 වසරේදී දක්නට ලැබේ.

පොල් ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන වල අපනයන ආදායමද 2013 වසරට සාපේක්ෂව 2014 වසරේදී 15%කින් ඉහල ගොස් ඇත.

# පොල් නිෂ්පාදිත අපනයන - 2013/2014

## සංසන්දනාත්මක සංඛ්‍යාලේඛණ

| නිෂ්පාදන වර්ගය | ප්‍රමාණය (මෙ.ටො.) | | | වටිනාකම (රු.මිලියන) | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | %වෙනස | 2013 | 2014 | %වෙනස |
| **1.පොල් මද නිෂ්පාදිතයන්** | | | | | | |
| 1) පොල් තෙල් | 1,720 | 3,976 | 131 | 797.77 | 2,435.31 | 205 |
| 1.1) නැවුම් පොල් තෙල් | 2,101 | 7,278 | 246 | 1,416.26 | 5,194.10 | 267 |
| 2) දිසිදි පොල් | 28,202 | 51,132 | 81 | 7,653.02 | 17,356.14 | 127 |
| 3) කොප්පරා | 71 | 4,776 | 6,627 | 19.45 | 1,033.80 | 5,215 |
| 4) ගෙඩි පොල් (1000 ගෙඩි) | 21,456 | 33,073 | 54 | 1,239.88 | 1,976.54 | 59 |
| 5) බීජ පොල් (ගෙඩි) | 2,021 | 2,950 | 46 | 0.890 | 0.67 | -25 |
| 6) තැඹිලි පොල් (ගෙඩි) | 570,215 | 1,980,199 | 247 | 42.65 | 131.55 | 208 |
| 7) පුන්නක්කු | 187 | 2,556 | 1,267 | 30.50 | 153.66 | 404 |
| 8) පොල් කිරම | 1,591 | 1,923 | 21 | 528.09 | 783.66 | 48 |
| 9) පොල් කිරි | 12,570 | 15,490 | 23 | 2,261.80 | 3,204.08 | 42 |
| 10) පොල් කිරිපිටි | 4,702 | 5,835 | 24 | 2,817.53 | 3,604.07 | 28 |
| 11) මේදය ඉවත් කල පොල් | 3,619 | 3,793 | 5 | 573.18 | 905.80 | 58 |
| 12) පොල් වතුර (ජන.-දෙසැ.) | -- | 767 | -- | -- | 139.80 | -- |
| 13) පොල් අරක්කු (ලීටර්) | 17,071 | 18,161 | 6 | 8.59 | 12.31 | 43 |
| 14) විනාකිරි (ලීටර්) | 24,007 | 33,945 | 41 | 3.69 | 6.89 | 87 |
| 15) ෆැටි ඇසිඩ | 2,447 | 2,554 | 4 | 205.75 | 253.16 | 23 |
| *උප එකතුව පොල් මද නිෂ්පාදිතයන්* | | | | **17,599.05** | **37,191.54** | **111** |
| **2.කෙඳි නිෂ්පාදිතයන්** | | | | | | |
| 16) ගුදිරි කෙඳි | 53,142 | 36,320 | -32 | 2,160.59 | 1,727.92 | -20 |
| 17) බ්‍රිස්ටල් කෙඳි | 10,251 | 16,409 | 60 | 606.37 | 848.46 | 40 |
| 18) අඹරන ලද කෙඳි | 41,406 | 74,744 | 81 | 2,007.63 | 3,967.09 | 98 |
| *උප එකතුව නිෂ්පාදිතයන්* | **104,799** | **127,473** | **22** | **4,774.59** | **6,543.47** | **55** |
| **3.පොල් කටු නිෂ්පාදිතයන්** | | | | | | |
| 19) පොල් කටු අඟුරු | 6,359 | 8,736 | 37 | 430.31 | 619.25 | 44 |
| 20) පොල් කටු හා පොල් කටු | 438 | 486 | 11 | 22.98 | 23.46 | 2 |
| කුඩු | 36,629 | 37,158 | 1 | 9,198.61 | 10,001.00 | 9 |
| 21) පොල් කටු සක්‍රිය කල කාබන් | | | | | | |
| *උප එකතුව කෙඳි නිෂ්පාදිතයන්* | **43,426** | **46,380** | **7** | **9,651.90** | **10,643.71** | **10** |
| **4.නිමි භාණ්ඩ නිෂ්පාදිතයන් (කොහු කෙඳි)** | | | | | | |
| 22) කොහු ලණු | 2,002 | 2,205 | 10 | 181.92 | 220.02 | 21 |
| 23) කොහු කඹ | 5,728 | 8,222 | 44 | 717.09 | 1,172.03 | 63 |
| 24) තවාෂි බුරුසු (සංඛ්‍යාව) | 28,204,993 | 26,788,155 | -5 | 587.81 | 573.53 | -2 |
| 25) කොසු හා බුරුසු (සංඛ්‍යාව) (තවාෂි බුරුසු හැර) | 21,298,535 | 25,130,090 | 18 | 2,451.68 | 2,995.99 | 22 |
| 26) රබර් මිශ්‍ර කොහු පැඩ හා ඇඳන් මෙට්ට(සංඛ්‍යාව) | 7,578,408 | 6,945,807 | -8 | 285.75 | 390.61 | 37 |
| 27) කොහු ලණු පැදුරු හාබුමුතුරුණු (වර්ග මීටර) | 568,759 | 635,149 | 12 | 688.38 | 786.11 | 14 |
| 28) කොහු කලාල (වර්ග මීටර) | 11,017 | 13,920 | 26 | 10.52 | 8.08 | -23 |
| 29) කොහු බත් | 143,911 | 157,177 | 9 | 5,931.56 | 6,488.97 | 9 |
| 30) පොල් ලෙලි කැබලි | 11,815 | 14,610 | 24 | 701.92 | 884.86 | 26 |
| 31) මිහිසළු | 3,362 | 3,672 | 9 | 482.55 | 519.90 | 8 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 32) උද්‍යාන වගා සඳහා යොදා ගන්නාකොහු නිෂ්පාදිතයන් | 58,136 | 54,747 | -6 | 3,698.04 | 4,231.06 | 14 |
| *උප එකතුව කොහු ආශ්‍රිත නිෂ්පාදිතයන්* | | | | **15,737.22** | **18,271.16** | **16** |
| **5.වෙනත් නිෂ්පාදිතයන්**<br>33) පොල් ඉරටු (මෙ.ටො.)<br>34) පොල් ලී (මෙ.ටො.) | <br>8,375<br>0.086 | <br>8,748<br>0.008 | <br>4<br>-91 | <br>188.99<br>0.25 | <br>217.18<br>0.02 | <br>15<br>-92 |
| **උප එකතුව (වෙනත් නිෂ්පාදිතයන්)** | | | | **189.24** | **217.20** | **15** |
| **මුළු අපනයන ආදායම** | | | | **47,952.00** | **72,867.08** | **52** |

*මූලාශ්‍ර40- ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

# 4. පරිපාලන අංශය

පරිපාලන අංශයේ මූලික පරමාර්ථය වනුයේ ආයතනයේ සියළු අංශයන් සඳහා සහාය සේවාවන් ලබාදීම හා පහසුකම් සැපයීම,අධිකාරියේ මනා පැවැත්ම හා ප්‍රවර්ධනය වෙනුවෙන් අදාළ වන සියලුම ආයතනික කටයුතු,මානව සම්පත් සංවර්ධනය හා පරිපාලන කටයුතු මෙහෙයවීමද එමඟින් ආයතනයේ අනෙකුත් ක්‍රියාකාරී අංශවලට ස්වකීය කාර්යයභාරය ඉටු කිරීමේදී සහායවීම මෙන්ම සමස්ත ආයතනයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වීමයි.

## 4.1 සේවක සංඛ්‍යාව

මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 258 කි.2014 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 178 වූ අතර එම සේවක සංඛ්‍යාව 27 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ..සේවක සංඛ්‍යාව පහත සේවා ගණයන්ගෙන් සමන්විත විය.

1. ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය
2. කළමනාකාර සේවා ගණය
3. කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය
4. ආශ්‍රිත නිලධාරී සේවා ගණය
5. කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය
6. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) සේවා ගණය
7. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය
8. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය
9. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය

## 4.2 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

මානව සම්පත අධිකාරියේ මෙහෙවර හා අරමුණු ලඟා කර ගැනීම සඳහා වඩා ඵලදායිව හා සඵලදායීව යොදා ගැනීමට හැකිවන පරිදි මෙම අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා 2014 වර්ෂයේ දේශීය පුහුණු සංවර්ධන පාඨමාලා විවිධ විෂයන් ඔස්සේ සංවිධානය කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී පුහුණු සංවර්ධන පාඨමාලා මෙහෙයවනු ලබන රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් පාඨමාලා සංවිධානය කිරීමට කටයුතු කර ඇත. 2014 වර්ෂයේ අධිකාරියේ එක් නිලධාරියෙකු එක් පුහුණු වැඩමුළුවක් සඳහා හෝ සහභාගි කරවීම පාලන අංශයේ අරමුණ විය.

පුද්ගල ආකල්ප හා කුසලතා වර්ධනය, නවක කාර්යය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවය පිළිබඳ අවබෝධය ලබා දීම, කණ්ඩායම් හැඟීම වර්ධනය, රැකියා පරිසරයේ ඇති වී තිබෙන නව්‍යතා හඳුන්වා දීම හා ආයතනික පරිසරය කෙරෙහි හැඩගැස්වීම අරමුණ විය.

ඒ අනුව කාර්යය මණ්ඩලය වෙනුවෙන් පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා වැය කරන මුදල් අනාගත ආයෝජනයක් සේ සලකා පුහුණු අවශ්‍යතා හඳුනාගෙන අදාල පුහුණු කටයුතු සඳහා යොමු කිරීම සිදු කරන ලදී.




(වැවිලි කළමණාකරණ ආයතනයේ පැවති පුහුණු වැඩමුළු අවස්ථා )

**4.2.1 2014 වර්ෂයේ දී සේවක මහත්ම මහත්මීන් පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් ආවරණය වූ පාඨමාලා හා සම්මන්ත්‍රණ / වැඩමුළු සඳහා සහභාගී කරවන ලදී.**

| අනු අංකය | පාඨමාලාවේ නම | සහභාගි වූ ගණන | ආයතනයේ නම | කාල සීමාව |
|---|---|---|---|---|
| 01 | Training on Development of Quality Manual & Operation Procedure based on ISO/IEC 17025: 2005 | 01 | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | දින 02 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | Effective Management Skills for the Administrative Officers | 02 | නිපුණතා සංවර්ධන පදනම | දින 02 |
| 03 | ලේඛණාගාර කළමණාකරණය | 01 | ප්‍රාග් ආයතනය | දින 01 |
| 04 | සඵලදායී සංනිවේදනය හා කාර්යාලීය ක්‍රියා පිළිවෙත් පිළිබඳ පුහුණු වැඩ සටහන | 42 | ජාතික වැවිලි කළමණාකාරිත්ව ආයතනය | දින 02 නේවාසික |
| 05 | One day Workshop on Skills for Work Life | 35 | නිපුණතා සංවර්ධන පදනම | දින 01 |
| 06 | training Programme on Energy Management system as per ISO 50001:2011 | 10 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | දින 03 |
| 07 | ISO 2200-2005 Food Safety Management System | 06 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | දින 02 |
| 08 | ISO 9001- Quality Management System | 10 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | දින 02 |
| 09 | Productivity & Accuracy Improvement for Waste Water Testing Laboratory Technicians | 02 | Institute for Techno Management (pvt.)ltd | දින 03 |
| 10 | Disciplinary Procedure | 02 | නිපුණතා සංවර්ධන පදනම | දින 02 |
| 11 | Public Procurement Procedure | 07 | නිපුණතා සංවර්ධන පදනම | දින 02 |
| 12 | Waste Water Testing Laboratory Technicians | 02 | Institute for Techno Management (pvt.)ltd | දින 03 |
| 13 | විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම | 01 | ඉදිකිරීම යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | දින 01 |
| 14 | ආකල්ප වර්ධනය හා සතුටින් වැඩ කිරීමේ කලාව | 31 | ජාතික වැවිලි කළමණාකාරිත්ව ආයතනය | දින 02 නේවාසික |

| | | | | |
|---|---|---|---|---|
| 15 | Public Recruitment Procedure | 05 | නිපුණතා සංවර්ධන පදනම | දින 02 |
| 16 | රියදුරු මහතුන් සඳහා පුද්ගල සංවර්ධන වැඩමුළුව | 12 | ජාතික වැව්ලි කළමණාකාරීත්ව ආයතනය | දින 02 නේවාසික |
| 17 | Secretarial Practices | 01 | නිපුණතා සංවර්ධන පදනම | දින 04 |
| 18 | Roll & Responsibilities of Leave Clerk | 02 | නිපුණතා සංවර්ධන පදනම | දින 02 |
| 19 | Scheme of Recruitment | 02 | නිපුණතා සංවර්ධන පදනම | දින 02 |
| 20 | Personal Grooming Business & Social Etiquette | 01 | නිපුණතා සංවර්ධන පදනම | දින 01 |
| 21 | Training ISO/IEC 17043:2010 | 02 | අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතිතන මණ්ඩලය | දින 02 |
| 22 | National Laboratory Confidence Conclave Accreditation delivery Confidence in Laboratory Testing | 03 | Sri Lanka Accreditation Board | දින 01 |
| 23 | Work Shop on Stress Management | 02 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | දින 01 |
| 24 | Basic Techniques of Microbiological analysis & Training on Microbiological analysis | 18 | ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය | දින 07 ½ |

**මීට අමතරව පරිපාලන අංශය පහත පරිදි අනෙකුත් ක්‍රියාකාරී අංශවලට ස්වකීය කාර්යයභාරය ඉටු කිරීමේදී සහායවීම සිදු කර ඇත.**

- මෙම අධිකාරිය සඳහා අනුමත කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම සහ බඳවා ගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා කාර්ය මණ්ඩල පරිපාලනයට අදාල සියළුම කටයුතු සිදු කිරීම.
- ආයතනයේ ස්ථාවර වත්කම් සම්බන්ධ වත්කම් ලේඛණ පවත්වාගෙන යාම,වාර්ෂික තොග සමීක්ෂණ සම්බන්ධ සියළු කටයුතු ඉටු කිරීම.
- සියළුම දේශීය මිලදී ගැනීම් වලට අමතරව ත්ත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයෙහි ස්ථාපිත කර ඇති ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ අංශය , රසායනික විශ්ලේෂණ අංශය හා සංවේදී රසායනාගාරය යන මූලික රසායනාගාර හා ඊට අනුබද්ධව පවතින මාධ්‍ය සැකසුම් ඒකකය සංවේදී උපකරණ අංශය හා සේදුම් ඒකකය වැනි තත්ත්ව පාලන ඒකක සඳහා අවශ්‍ය රසායනාගාර උපකරණ ,රසායනික ද්‍රව්‍ය ආනයනය කිරීම් සම්බන්ධ සියළු කටයුතු සිදු කිරීම
| 02. ජේ.පී.ඩී.එම්. ලංකාපුර | 1,200.00 | |
| 03. චමිල වසන්ත | 1,200.00 | **3,600.00** |
| | | **32,000.00** |

**9** විවිද තැම්පතු

| | |
|---|---|
| 01. ඔටෝ සුපර් සර්විස් සෙන්ටර් | 250,000.00 |
| 02. ලංකා ගෑස් සමාගම | 1,950.00 |
| 03. සී.ආර්.අයි. - විදුලිබල තැන්පතු | 130,000.00 |
| 04. එල්.ඩී.ආර්. ප්‍රියංකා මිය (වැඩ බලන අයකැමි) | 6,366.78 |
| 05. කම්මල්පත්තුව (සී.පී.සී.එස්.) සමාගම | 10,000.00 |
| 06. වයි.කේ.සී. ජයතිලක මයා | 10,545.46 |
| 07. අපනයන සංවර්ධන මණ්ඩලය | 10,000.00 |
| 08. එම් එෆ් එන්ටර්ප්‍රයිසස් | 10,000.00 |
| | **428,862.24** |

***10*** **භාණ්ඩාගාර බිල්පත්**
**ජී.බී.ඕ.**

භාණ්ඩාගාර බිල්පත් — රු

354 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණ අංක 355/02අනුව, 1998වසරේදී, ලංකා බැංකුවේ හයිඩ් පාර්ක් කෝනර් ශාඛාවේ පවත්වා ගෙන යනු ලැබූ ජංගම ගිණුමේ පැවති රජයේ ප්‍රදානයක කොටසක් වූ රු.2,858,988.08 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලැබීය. — 16,012,979.04

මෙම මුදල සඳහා රු.16, 012, 979.04 ක් සමුච්චිත පොළිය වශයෙන් ලැබී තිබුණි.

පැරණි සහ භාවිතා කළ නොහැකි මෝටර් රථ අපහරණය කිරිමෙන් රු. 2,202,009.36ක මුදලක් ලැබුණි. මෙමමුදල ලංකා බැංකුව හරහා භාණ්ඩාගාර බිල්පත් ලෙස ආයෝජනය කළ අතර මේ සඳහා රු.6,093,655.91ක මුදලක් සමුච්චිත පොළිය වශයෙන් ලැබී තිබුණි. — 6,093,655.91

22,106,634.95

ප්‍රාග්ධන සංවර්ධන අරමුදල

| ආයෝජනය කළ දිනය | කාල පරිච්ඡේදය | කල් පිරෙන දිනය | පොළී අනුපාතිකය | ආයෝජනය කරන ලද මුදල |
|---|---|---|---|---|
| 2014-04-25 | පළමු වසර | 24-04-2015 | 6.40% | 5,718,315.26 |
| 2014-08-01 | පළමු වසර | 31-07-2015 | 6.40% | 4,011,409.50 |
| 2014-08-10 | පළමු වසර | 31-07-2015 | 6.75% | 782,400.72 |
| | | | | **10,512,125.48** |

පොල්තෙල් අරමුදල සඳහා
වනස්ථායිකරණ යෝජනා ක්‍රමය

**කප්රුක ණය ස්ථාවර තැන්පතු**

| ස්ථාවර තැන්පතු ලදුපත් අංකය | ස්ථාවර තැන්පතු අංකය | **2014/12/31** දින වන විට ස්ථාවර තැන්පතුවේ වටිනාකම |
|---|---|---|
| 204-60-01-00013213-6 | A 779255 | 23,134,425.26 |
| 204-60-01-00013169-0 | A 779216 | 5,348,040.18 |
| 204-60-01-00013172-5 | A 779219 | 5,348,040.18 |
| 204-60-01-00013171-6 | A 779218 | 5,348,040.18 |
| 204-60-01-00013168-1 | A 779215 | 5,348,040.18 |
| 204-60-01-00013174-3 | A 779221 | 10,696,080.36 |
| 204-60-01-00013175-2 | A 779222 | 10,696,080.36 |
| 204-60-01-00013173-4 | A 779220 | 10,696,080.36 |
| 204-60-01-00013176-1 | A 779223 | 4,555,851.54 |
| 204-60-01-00013309-1 | A 779345 | 29,528,678.00 |
| 204-60-01-00010508-6 | A 549681 | 25,623,745.28 |
| 204-60-01-00012003-2 | A 671603 | 5,832,042.44 |
| 204-60-01-00013930-8 | A905950 | 2,575,932.36 |
| මුළු මුදල | | 144,731,076.68 |

2014.12.31 දින වන විට ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය 1,057,451.33

2014.12.31 දින වන විට ශේෂය 145,788,528.01 5,788,528.01

පොල් තෙල් අරමුදල සඳහා වනස්ථායිකරණ යෝජනා ක්‍රමයේ භාණ්ඩාගාර බිල්පත්

| ආයෝජනය කළ දිනය | කාල පරිච්ඡේදය | කල් පිරෙන දිනය | පොලී අනුපාතිකය | ආයෝජනය කරන ලද මුදල |
|---|---|---|---|---|
| 10-10-2014 | දින 350 | 25-09-2015 | 5.30% | 165,975.70 |
| 20-06-2014 | වසර 1 | 19-06-2015 | 6.75% | 373,825.70 |
| 20-06-2014 | වසර 1 | 19-06-2015 | 6.75% | 2,123,986.55 |
| 30-05-2014 | වසර 1 | 29-05-2015 | 6.75% | 295,322.67 |
| 23-05-2014 | වසර 1 | 22-05-2015 | 6.75% | 2,654,670.30 |
| 21-03-2014 | වසර 1 | 20-03-2015 | 6.75% | 2,346,525.15 |
| 07-03-2014 | වසර 1 | 03-03-2015 | 6.80% | 584,092.95 |
| 21-02-2014 | වසර 1 | 20-02-2015 | 6.80% | 3,334,521.13 |
| 29-11-2014 | වසර 1 | 20-11-2015 | - | 65,717,655.81 |
| | | | | 77,596,575.96 |

| ජා.ප.ආ. ව්‍යාපෘති අරමුදල ආයෝජන දිනය | කාල පරිච්ඡේදය | කල් පිරෙන දිනය | පොලී අනුපාතිකය | ආයෝජනය කරන ලද මුදල |
|---|---|---|---|---|
| 10-10-2014 | දින 91 | 09-01-2015 | 5.00% | 59,215.78 |
| 05-12-2014 | දින 91 | 06-03-2015 | 5.10% | 19,830.18 |
| 30-05-2014 | දින 365 | 29-05-2015 | 6.75% | 81,955.96 |
| | | | | **161,001.92** |
| | | | | **110,376,338.31** |

**11 පූර්ව ගෙවීම්**

| | | |
|---|---|---|
| **ජී.බී.ඔ.** | 60,969.75 | |
| මෝටර් වාහන රක්ෂණය | 4,135.86 | |
| ගෙවීම් තහවුරු විය යුතු මූල්‍ය රක්ෂණ මුදල් | 418,241.85 | |
| කාර්යාල උපකරණ මත සේවා ගාස්තු | 2,290,760.46 | |
| විදුලි සංදේශ ගාස්තු | 119,448.00 | |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 6,500.00 | |
| ගිනි රක්ෂණය | 86,246.70 | **2,986,302.62** |

**12 විවිධ ණය හිමියන්**

**ජී.බී.ඔ.**

| | | |
|---|---|---|
| සේ.හා.අ. මණ්ඩලය | 172,437.90 | |
| විගණකාධිපති දෙපාර්තුමේන්තුව | 700,000.00 | |
| කොළඹ මහනගර සභාව (සීවරලයින් ව්‍යාපෘතිය) | 1,327,820.72 | |
| ශ්‍රී ලංකා මහ බැංකුව (අර්ථ සාධක අරමුදල) | 1,088,947.55 | |
| ගෙවිය යුතු කාසි | 986.72 | |
| මධ්‍යම ඉංජිනේරු ඉදිකිරීම් කාර්යාංශය | 463,941.52 | |
| | | **3,754,134.41** |

**2014.12.31 දිනටම්ලදී ගැනීම් සම්බන්ධ ණය හිමියෝ**

| | | |
|---|---|---|
| ඇනලිටිකල් ඉන්ස්ටෲමන්ට් (පුද්) සමාගම | 137,194.10 | |
| බ්‍රවුන්ස් ඇන්ඩ් කම්පැනි | 15,357.24 | |
| ප්‍රේම් හුඩ් ඉන්ඩස්ට්‍රියල් ටෙක්නොලොජි | 515,200.00 | |
| එස්.කේ. මුණසිංහ මෝටර්ස් | 133,560.00 | |
| ඩේටා ටෙක් බිස්නස් සෙන්ටර් | 38,520.00 | 839,831.34 |
| | | **4,593,965.75** |

| | |
|---|---|
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 10,000.00 |
| මංචනායක ඔයිල් මිල්ස් | 135,000.00 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 300,000.00 |
| ණය හිමියෝ | 34,630.65 |
| | **479,630.65** |

**13.ජී.බී.ඔ.**

<u>තත්ත්ව සහතික</u>

| | | |
|---|---|---|
| ශ්‍රී ලාංකික හා විදේශීය | 3,947.59 | |
| සී.ඩබ්. මැකී සහ සමාගම | 7,828.88 | |
| ඩෙසිකො ලංකා එක්ස්පෝර්ට්ස් | 4,108.31 | |
| ජී.පී.ද සිල්වා | | **15,884.78** |

<u>ආපසු ගෙවිය යුතු තැන්පතු</u>

| | | |
|---|---|---|
| ග්ලෝබල් සයන්ටිෆික් සිස්ටම් (පුද්) සමාගම | 5,000.00 | |
| බයෝමෙඩ් ඉන්ටනැෂනල් (පුද්) සමාගම | 5,000.00 | |
| ඇනලිටිකල් ඉන්ස්ටෲමන්ට් (පුද්) සමාගම | 5,000.00 | |
| හෙම්සන් ඉන්ටනැෂනල් (පුද්) සමාගම | 5,000.00 | |
| ටොයෝටා ලංකා (පුද්) සමාගම | 5,000.00 | **25,000.00** |

<u>ආරක්ෂක තැන්පතු</u>

| | | |
|---|---|---|
| එල්.ඩී.ආර්. ප්‍රියංකා මහත්මිය | 6,366.78 | |
| වයි.සී.කේ. ජයතිලක මහතා | 10,545.46 | **16,912.24** |

ටෙන්ඩර් තැන්පතු

| | |
|---|---|
| ඉරාම් ආර්ම් සෙකියුරිටි සර්විසස් (පුද්) සමාගම. | 10,000.00 |
| ෆීල්ඩ් සෙකියුරිටි සර්විස් | 5,000.00 |
| රීගල් වින්ස් සෙකියුරිටි සර්විස් | 5,000.00 |

| | |
|---|---|
| එස්. සෙල්වකුමාර | 4,000.00 |
| ඔෂන් නරෙයින්සර්විස් | 5,000.00 |
| ඩබ්.ඊ. සෙකියුරිටි සර්විස් | 5,000.00 |
| ලංක්වුැඩ ඉන්ටර් නැෂනල් (පුද්) සමාගම | 50,000.00 |
| ස්ට්‍රේලියින් ඉන්ටර් නැෂනල් (පුද්) සමාගම | 50,000.00 |
| කන්ස්ට්‍රක්ෂන් ඉංජිනියරින් (පුද්) සමාගම | 5,000.00 |
| නාමල් කාරියවසම් | 5,000.00 |
| අස්සලාරච්චි කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම | 5,000.00 |
| අඩාම්ජී ලුක්මාන්ජී (පුද්) සමාගම | 5,000.00 |
| ශ්‍රීපා කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම | 5,000.00 |
| රයිස් මිල්ක් කොම්පෝස්ට් ෆැබ්රික් | 5,000.00 |
| එච්.ඩී.ගුණසිරි | 5,000.00 |
| සුනිල් වැල්ඩින් වර්ක් ෆර්නිචර් | 5,000.00 |
| සයන්ටිෆික් ඉන්ස්ටෘමන්ට් (පුද්) සමාගම | 10,000.00 |
| ඩබ්.ඊ.සෙකියුරිටි සර්විසස් (පුද්) සමාගම | 5,000.00 |
| සී.පී.ලංකා (පුද්)සමාගම. | 5,000.00 |
| ජී.බී.සෙකියුරිටි සර්විසස් (පුද්) සමාගම | 5,000.00 |
| ජී.කේ.අයි.එල්.අමරසිංහ | 5,000.00 |
| පී.සී ට්‍රේඩින් (පුද්) සමාගම | 125,871.00 |
| ජානක මංචනායක | 5,000.00 |
| ඊගල් වින්ග්ස් සිකියුරිටි | 5,000.00 |
| යුනි ලංකා සෙකියුරිටි සර්විසස් (පුද්) සමාගම | 5,000.00 |
| ක්වීන් ස්ටාර් සිකියුරිටි සර්විසස් | 5,000.00 |
| ගජශක්ති සිකියුරිටි සර්විසස් | 5,000.00 |
| කොමර්ෂල් ෆීල්ඩ් සිකියුරිටි සර්විස් | 5,000.00 |
| රිලයබල් ඇන්ඩ් ඇලර්ට් සිකියුරිටි | 5,000.00 |
| ඩබ්.ජේ. සිකියුරිටි සර්විස් | 5,000.00 |

| | | |
|---|---|---|
| සී.පී. ලංකා (පුද්) සමාගම | 5,000.00 | |
| පයනියර් සිකියුරිටි සර්විස් | 5,000.00 | |
| එයාවින් ගාඩ් ෆර්ස් සිකියුරිටි | 5,000.00 | |
| ඩෙසිකෝ ලංකා එක්ස්පෝර්ට් | 50,000.00 | |
| ලංකා කොකනට් කන්සෝර්ටින් (පුද්) සමාගම | 50,000.00 | **484,871.00** |
| **ලැබුණු අත්තිකාරම්** | | |
| විලච් ප්ලාන්ටේෂන්ස්(මාස 1 ) | 360,000.00 | |
| කුරුණෑගල ප්ලාන්ටේෂන්ස් (මාස 3) | 390,000.00 | |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (මාස 3) | 825,000.00 | 1,575,000.00 |
| | | **2,117,668.02** |

<u>ප්‍රාග්ධන සංවර්ධන අරමුදල</u>

<u>ආපසු ගෙවිය යුතු තැන්පතු</u>

| | | |
|---|---|---|
| ආරම්භක ශේෂය | 60,000.00 | |
| කොන්සෙයාර් (පුද්) සමාගම | 50,000.00 | |
| ග්‍රීන් සීපෝ කොයර් එක්ස්පෝර්ට් (පුද්) සමාගම | 50,000.00 | |
| කප්රුක සමතිය | 50,000.00 | |
| සන්කෑන් එක්ස්පෝර්ට් ලංකා (පුද්) සමාගම | 50,000.00 | |
| සුමිත් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම | 50,000.00 | **310,000.00** |

**14** <u>කලින් ලැබුණු මුදල්</u>

**ජී.බී.ඕ.**

| | |
|---|---|
| තෙල් මෝල් හිමියන් ලියාපදිංචි කිරීම | 282,800.00 |
| වෙන්දේසිකරුවන්/ තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම | 15,000.00 |
| පොල් වෙළඳුන් ලියාපදිංචි කිරීම | 9,000.00 |
| පොල් මඳ ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන ලියාපදිංචි කිරීම | 773,000.00 |
| පොල් මඳ ආශ්‍රිත සුළු නිෂ්පාදන ලියාපදිංචි කිරීම | 195,250.00 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 275,500.00 |
| පොල් වතු ලියාපදිංචි කිරීම | 45,400.00 |

| | | |
|---|---|---|
| කෙඳි හා කෙඳි නිෂ්පාදන අපනයනකරුවන් | 1,861,000.00 | |
| කෙඳි මෝල් ලියාපදිංචි කිරීම | 33,723.00 | |
| දිසිඳි පොල් මෝල් ලියාපදිංචි කිරීම | 120,000.00 | |
| පොල් බහු නිෂ්පාදන අලෙවිකරුවන් ලියාපදිංචි කිරීම | 77,318.40 | |
| | | 3,687,991.40 |

**15** <u>උපචිත වියදම්</u>

<u>පී.බී.ඕ.</u>

| | | |
|---|---|---|
| සන්නිවේදනය | 53,128.28 | |
| විදුලිය සහ ජලය | 347,029.79 | |
| ආරක්ෂක සේවා | 121,265.76 | |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 118,304.02 | |
| ගමන් වියදම් | 373,609.05 | |
| අතිකාල සහ නිවාඩු දින වැටුප් | 250,617.00 | |
| වාහන අළුත්වැඩියාව සහ නඩත්තුව | 56,572.00 | |
| යන්ත්‍රෝපකරණ හා පිරියත අළුත්වැඩියාව සහ නඩත්තුව | 22,457.80 | |
| ජාතිය ගොඩනැඟීමේ බද්ද | 70,567.13 | |
| ප්‍රවාහනය | 138,400.00 | |
| පවිත්‍රතා සේවා | 16,700.00 | |
| රක්ෂණය | 31,123.00 | |
| වැටුප් | 9,685.89 | |
| | | 1,609,459.72 |

| | | |
|---|---|---|
| **16** | 2014.01.01 දිනට ශේෂය | 51,887,628.83 |
| | එකතු කළා : 2014 වසර සඳහා ලැබුණු භාණ්ඩාගාර ප්‍රදාන | 4,006,192.44 |
| | 2014 වසර සඳහා ලැබුණු ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | (15,561,998.84) |
| | 2014.12.31 දිනට ශේෂය | **40,331,822.43** |
| **17** | <u>ප්‍රාග්ධන සංවර්ධන ප්‍රදාන</u> | |
| | 2014.12.31 දිනට ශේෂය | **77,652,767.37** |

## 18 වියදම්වලට සාපේක්ෂව සමුච්චිත ආදායම

| | |
|---|---|
| **ජී.බී.ඖ.** | |
| 2014.01.01 දිනට ශේෂය | (125,890,876.00) |
| පූර්වවර්ෂය සඳහා ගැළපීම් ( ස්ථාවර වත්කම් අපහරණය කිරීම) | (6,337.53) |
| අතිරික්තය/(හිඟය) | 708,683.18 |
| 2014.12.31 දිනට ශේෂය | **(125,188,530.35)** |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | |
| 2014.01.01 දිනට ශේෂය | **67,171,433.61** |
| අතිරික්තය/(හිඟය) | **(1,015,213.03)** |
| 2014.12.31 දිනට ශේෂය | **66,156,220.58** |
| පොල්තෙල් අරමුදල සඳහා වන මිල ස්ථායිකරණ යෝජනා ක්‍රමය | |
| 2014.01.01 දිනට සමුච්චිත අරමුදල | 271,788,655.18 |
| පූර්ව වර්ෂය සඳහා ගැළපීම් (2013.12.31 දිනට කප්රුක ණය ශේෂය ගැළපීම) | (228,999.06) |
| අතිරික්තය/(හිඟය) - 2014 | 15,751,064.83 |
| 2014.12.31දිනට සමුච්චිත අරමුදල | **287,310,720.95** |
| ජා.ප.අ. ව්‍යාපෘති අරමුදල | |
| 2014.01.01 දිනට ශේෂය | 152,313.98 |
| ලැබුණු පොළිය | 12,640.66 |
| 2014.12.31 දිනට ශේෂය | **164,954.64** |
| මෝල් සංවර්ධන අරමුදල | |
| 2014.01.01 දිනට ශේෂය | 81,073,462.00 |
| 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රදාන | 10,144,413.72 |
| ලැබුණු පොළී | 3,346,199.11 |
| තැන්පතු ආපසු ගැනීම් | (20,437,483.00) |
| 2014.12.31 දිනට ශේෂය | **74,126,591.83** |

# පොල් සංවර්ධන අධිකාරිය

## 2014.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සඳහා සටහන්

**1 පොළී ආදායම**

**ජී.බී.ඕ.**

| | | |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය මත පොළිය | 599,237.71 | |
| ලෝකෝර් ආර්යා ණය අරමුදල මත පොළිය | 93,861.55 | |
| ආයෝජන මත පොළිය (භාණ්ඩාගාර බිල්පත්) | 1,780,102.31 | |
| ස්ථාවර තැන්පතු මත පොළිය | 540,584.86 | 3,013,786.43 |
| **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | | |
| භාණ්ඩාගාර බිල්පත් මත පොළිය | 861,787.31 | |
| | | 861,787.31 |
| **පොල් තෙල් අරමුදල සඳහා වනමිල ස්ථායිකරණ යෝජනා ක්‍රමය** | | |
| භාණ්ඩාගාර බිල්පත් මත පොළිය | 2,915,671.74 | |
| එස්අයිටීඑස් අරමුදල මත පොළිය | 2,040,553.23 | |
| බැංකු ණය මත පොළිය | 1,003,989.47 | |
| ස්ථාවර තැන්පතු මත පොළිය | 9,760,456.96 | |
| ඉතිරි කිරීමේ ගිණුම් මත පොළිය | 30,393.43 | 15,751,064.83 |
| **ජා.ප.ආ.ව්‍යාපෘති අරමුදල - භාණ්ඩාගාර බිල්පත් මත පොළිය** | | 12,640.39 |
| | | **19,639,278.96** |

**2.බදු ආදායම**

**ජී.බී.ඕ.**

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 3,300,000.00 | |
| හලාවත වැවිලි සමාගම | 4,320,000.00 | |
| කුරුණෑගල වැවිලි සමාගම | 1,560,000.00 | 9,180,000.00 |
| **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | | |
| බදු ආදායම | 597,338.32 | |
| | | **597,338.32** |
| | | **9,777,338.32** |

3. ලියාපදිංචි කිරීමේ ගාස්තු

ජී.බී.ඔ.

| | | |
|---|---|---|
| පොල් මද ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන අපනයනකරුවන් | 598,500.00 | |
| පොල් මද ආශ්‍රිත සුළු නිෂ්පාදන අපනයනකරුවන් | 1,203,870.00 | |
| කෙදි හා කෙදි නිෂ්පාදන අපනයනකරුවන් | 1,397,572.60 | |
| කොප්පරා වෙළඳුන් ලියාපදිංචි කිරීම | 69,000.00 | |
| වෙන්දේසිකරුවන්/තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම | 36,000.00 | |
| පොල් වතු හිමිකරුවන් ලියාපදිංචි කිරීම | 96,900.00 | |
| දිසිදි පොල් මෝල් හිමිකරුවන් ලියාපදිංචි කිරීම | 298,760.00 | |
| පොල්තෙල් මෝල් හිමිකරුවන් ලියාපදිංචි කිරීම | 209,951.20 | |
| කෙදි මෝල් හිමිකරුවන් ලියාපදිංචි කිරීම | 238,480.52 | |
| ලියාපදිංචි කිරීමේ ප්‍රමාද ගාස්තුව | 141,720.26 | |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 277,192.50 | |
| පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන සහ නිමි භාණ්ඩ ලියාපදිංචි කිරීම | 379,412.64 | |
| | | **4,947,359.72** |

| | | |
|---|---|---|
| 4.තොග ගාස්තු ආදායම් - කොප්පරා සහ ගෙඩි පොල් | | **2,930,388.48** |

5.රසායනාගාර ආදායම

| | | |
|---|---|---|
| තත්ව සහතික | 2,451,360.78 | |
| රසායනාගාර පරීක්ෂණ ගාස්තු | 1,851,397.27 | |
| ජල සාම්පල් ගාස්තු | 875,044.42 | |
| | | **5,177,802.47** |

6.විවිධ ආදායම්

ජී.බී.ඔ.

| | |
|---|---|
| ටෙන්ඩර් තැන්පතු | 46,000.00 |
| සහරා අලෙවිය | 136,635.00 |

| | | |
|---|---|---|
| වාහන කුලී ගාස්තු | 46,265.85 | |
| විවිධ ආදායම් | 20,631.22 | |
| ලේබල් ගාස්තු | 1,665,500.00 | |
| | | **1,915,032.07** |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | | |
| සහනාධාර ප්‍රතිපූරණය කිරීම | 600,000.00 | |
| බෙදා හරින ලද යන්ත්‍ර සඳහා ලබා දුන් ණය මුදල් ආපසු අය කර ගැනීම | 189,272.00 | |
| දිවි නැඟුම ව්‍යාපෘති | 3,959,384.19 | |
| තාක්ෂණික සහාය ගාස්තු | 55,207.34 | |
| | | **4,803,863.53** |
| | | **6,718,895.60** |
| 7 අලෙවි සංවර්ධන හා පර්යේෂණ වැඩසටහන් | 32,401,942.73 | |
| <u>කප්රුක ඉසුරුසල - නාරාහේන්පිට - ලාභාලාභ ගිණුම</u> | 140,996.88 | |
| | | **32,542,939.61** |

ඒ සටහන

කප්රුක ඉසුරුසල - නාරාහේන්පිට - ලාභාලාභ ගිණුම

| | | |
|---|---|---|
| විකුණුම් | | 1,391,042.39 |
| 2014.01.01 දිනට තොගය | 646,666.41 | |
| මිලදී ගැනීම් | 796,890.56 | 1,443,556.97 |
| | | 52,514.58 |
| අඩු කළා: 2014.12.31 දිනට තොගය | | - |
| | | 52,514.58 |
| අඩු කළා: වියදම් | | 88,482.30 |
| ශුද්ධ ලාභය/(අලාභය) | | **140,996.88** |

| | | |
|---|---|---|
| **8.**පිරිසැකසුම් සංවර්ධන වැඩසටහන් දුන්කන්නාව ව්‍යාපෘති වියදම් | | **42,113,142.24** |
| ස්ථාවර වත්කම් පිරිවැය | 8,766,410.10 | |
| සමුච්චිත ක්ෂය කිරීම් | (6,598,421.75) | |
| | **2,167,988.35** | |
| 2014.01.01 දිනට කොහු තොගය | 463,617.67 | **2,631,606.02** |
| **9.**තත්ව පාලන හා තත්ව ආරක්ෂණ ISOප්‍රතීතන වැඩසටහන්සඳහා රසායනාගාරවියදම්හා අනෙකුත් වියදම් | | **1,691,614.71** |
| 10.දුන්කන්නාව මාරු කිරීම් | | **2,631,606.02** |

| මෝල් අංකය | මෝල්කරුගේ නම | එකතුව (රු.) | මෝල් අංකය | මෝල්කරුගේ නම | එකතුව (රු.) |
|---|---|---|---|---|---|
| M - 63 | විලච් ඩී.සී. ඇන්ඩ් ඔයිල් මිල්ස් | 27,454.92 | M - 110 | උණගහදෙණිය මිල්ස් | 9,883.58 |
| M - 64 | රත්කරව්ව ඩී.සී. ඇන්ඩ් ඔයිල් මිල්ස් | 29,172.08 | M - 111 | කුඩිරිප්පු ඩී.සී. මිල්ස් | 18,772.04 |
| M - 67 | මාරවිල සී.පී.සී.එස්. (පුද්) සමාගම | 13,672.23 | M - 113 | බැලුම්මහර ඩී.සී. මිල්ස් | |
| M - 69 | බදුවත්ත මිල්ස් | 30,969.68 | M - 119 | මාතම්මාන ඩී.සී. මිල්ස් | |
| M - 71 | මාදම්පේ මිල්ස් (පුද්) සමාගම | 14,476.44 | M - 122 | ශාන්ත ජෝසප් ඩී.සී.ඇන්ඩ් ෆයිබර් මිල්ස් | |
| M - 72 | ශාන්ත ජෝසප් ඩී.සී. මැනුෆැක්චර්ස් (පුද්) සමාගම | 17,364.48 | M - 124 | මිනුවන්ගොඩ මිල්ස් | |
| M - 75 | සිරියංගනි ඩී.සී. ඇන්ඩ් ෆයිබර් මිල්ස් | 29,180.18 | M - 126 | ලක්ෂ්මිඩී.සී. මිල්ස් | |
| M - 76 | එස්.ඒ. සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා (පුද්) සමාගම | 37,508.87 | M - 127 | වික්ටෝරියා ඩී.සී. මිල්ස් | |
| M - 77 | ශාන්ත ඇන්ස් ඩී.සී. ෆැක්ට්‍රි | 22,284.77 | M - 130 | බෝයගනේ ඩී.සී. මිල්ස් | |
| M - 79 | රේණුකා ඇග්‍රෝ එක්ස්පෝර්ට් (පුද්) සමාගම | 4,478.20 | M - 131 | ජයකොඩි ඩී.සී. මිල්ස් (පුද්) සමාගම | |
| M - 80 | දූනගහ සී.පී.සී.එස්. සමාගම | 20,927.60 | M - 133 | උපාලි ඩී.සී. මිල්ස් | |
| M - 84 | පොත්තේවෙල ඩී.සී. ඇන්ඩ් ඔයිල් මිල්ස් | 8,947.27 | M - 134 | ගුණවර්ධන ඩී.සී. මිල්ස් | |
| M - 85 | විකි ප්ලාන්ටේෂන් (පුද්) සමාගම | 26,666.88 | M - 136 | වෙල්වින් ඩී.සී. මිල්ස් | |
| M - 86 | ජේ.පී.එම්. පින්ටෝ ඇන්ඩ් කම්පැණි (පුද්) සමාගම | 2,239.10 | M - 138 | රිම්සර කොකනට් ප්‍රොඩියුසස් | |
| M - 87 | ශාන්ත වැලන්ටයින් ඩී.සී. මිල්ස් | 8,956.42 | M - 139 | සන්හිඳ මිල්ස් (පුද්) සමාගම | |
| M - 88 | සොනික් එක්පෝ (පුද්) සමාගම | 28,450.34 | M - 141 | කටාන ඩී.සී. මිල්ස් | |
| M - 89 | කුඩාවැව මිල්ස් | 13,843.77 | M - 142 | ලංකා යුනයිටඩ් ඩී.සී. මිල්ස් | |
| M - 90 | නැදුන්ගමුව මිල්ස් | 12,941.09 | M - 144 | ස්වාති | |
| M - 91 | සඳලංකාව සී.පී.සී.එස්. (පුද්) සමාගම | 27,993.29 | M - 145 | දූනගහ සී.පී.සී.එස්. සමාගම | |
| M - 93 | ග්‍රීන් පාල්ම් ඩී.සී. මිල්ස් | 14,947.12 | M - 147 | සක්සෙල් නැචුරල් ප්‍රොඩක්ට්ස් (පුද්) සමාගම | |
| M - 94 | සිරිකත ඩී.සී. මිල්ස් | 4,478.21 | M - 148 | ආර්.එම්.පී. කොකනට් ප්‍රොඩියුසස් | |
| M - 95 | සිබීඑල් කොකෝස් (පුද්) සමාගම | 13,791.05 | | | |
| M - 97 | ගෝල්ඩන් ක්‍රවුන් ඩී.සී. මිල්ස් | 73,850.58 | | | |
| M - 98 | එච්.සී.ඊ. සොයිසා සහ සමාගම | 21,792.44 | | | |
| M- 102 | මාවතගම ඩී.සී. මිල්ස් | 28,790.16 | | | |
| M - 103 | ශාන්ත තෙරේසා ඩී.සී. මිල්ස් | 13,265.45 | | | |
| M - 105 | ඩයි ඇන්ඩ් ඩූ රාජපක්ෂ (පුද්) සමාගම | 205.19 | | | |
| M - 107 | චන්ද්‍රා ඩී.සී. මිල්ස් | 21,001.85 | | | |
| M - 108 | බතුලුඔය ඩී.සී. මිල්ස් | 14,415.17 | | TOTAL | 996,659.08 |

## ගෙඩි පොල් සහ කොප්පරා තොග ගාස්තු
## 2014.12.31 දිනට ණය ගැතියෝ

| කොප්පරා | | මුදල (රු.) |
|---|---|---|
| 01. බී පී ඩේවිඩ් කම්පැනි | (1,361.25) | |
| 02. ජී. ඇන්ඩ් ජේ. මැතිව් ඇන්ඩ් කම්පැණි (පුද්) සමාගම | | 44,609.55 |
| 02. එල් එස් ටී ඩී එස් විජේරත්න ඇන්ඩ් කම්පැනි | | 10,914.40 |
| **ගෙඩි පොල්** | | |
| 01. ජාතික පශු සංවර්ධන මණ්ඩලය | | 106,199.76 |
| 02. හලාවත වැවිලි සමාගම | | 203,867.75 |
| 03. පොල් පර්යේෂණ ආයතනය | | 18,945.79 |
| 04. පොල් වගාකිරීමේ මණ්ඩලය | | 229,836.64 |
| 05. පී.ටී.කේ. ධයසේන මයා | | - |
| 06 පී.පී. ගුණසේකර මයා | | 1,296.60 |
| 07. ලාලන් රබර් (පුද්) සමාගම | | 41,300.53 |
| 08. කුරුණෑගල වැවිලි සමාගම | | 21,488.58 |
| 09. ඇල්කඩුව වැවිලි සමාගම | | 110,606.41 |
| 10. එච්.එල්. ද මෙල් ඇන්ඩ් කම්පැණි (පුද්) සමාගම | | 21,605.42 |
| 11. සී. දිපාල් මැතිව් මයා | | 1,397.71 |
| 12. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග | | (5,364.10) |
| 13. කෑගල්ල වැවිලි සමාගම | | (2,458.84) |
| 14. ඒ.වී.ඒ. සුමනපාල | | (1,142.40) |
| 15. දික්ලන්ද වතුයාය | | 3,042.04 |
| 16. පොල් කනත්තේ වතුයාය | | 252.00 |
| | | **805,036.59** |

## පොල් සංවර්ධන අධිකාරිය
## 2014 වසර සඳහා වියදම්

| 2013 | විස්තරය | උප එකතුව | එකතුව රු. |
|---|---|---|---|
| | **පුද්ගල පඩි නඩි** | | |
| 36,790,239 | අර්ථසාධක අර මුදල ද ඇතුළත්ව වැටුප් සහ වේතන | 39,280,168.74 | |
| 10,277,612 | ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් දීමනා | 23,474,270.89 | |
| 8,188,325 | සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල | 10,846,785.19 | |
| 3,748,276 | අතිකාල හා නිවාඩු දින සඳහා ගෙවීම් | 4,023,512.09 | |
| 296,431 | සභාපතිවරයාගේ සංග්‍රහ දීමනා | 223,507.00 | |
| 626,469 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා දීමනා | 825,346.13 | |
| 427,654 | පුහුණු සහසම්මන්ත්‍රණ | 1,321,670.00 | |
| **60,355,004** | | 79,995,260.04 | **79,995,260.04** |
| | **ගමන් වියදම්** | | |
| 1,353,514 | **ගමන් වියදම් (දේශීය)** | 2,415,979.99 | |
| - | **ගමන් වියදම් (විදේශීය)** | - | |
| 1,158,957 | බිම් කුලී හා කුලී ගාස්තු | 214,860.00 | |
| 201,929 | වෙළඳපොළප්‍රවර්ධනය | 220,504.89 | |
| **2,714,400** | | 2,851,344.88 | **2,851,344.88** |
| | **සැපයුම් සහ අත්‍යාවශ්‍යද්‍රව්‍ය** | | |
| 4,669,800 | ලිපි ද්‍රව්‍ය සහ වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය | 5,238,908.14 | |
| 5,091,865 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 5,784,048.70 | |
| 179,067 | මැහුම් කුලී ඇතුළු නිල ඇඳුම් වියදම් | 250,620.00 | |
| 130,305 | පොත් සහ වාර සහරා | - | |
| 6,160,969 | වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය (රසායනාගාර සඳහා රසායනික ද්‍රව්‍ය) | 9,865,402.48 | |
| | වෙනත් අවශ්‍යතා | 190,477.50 | |
| **16,232,007** | | 21,329,456.82 | **21,329,456.82** |
| | **අළුත්වැඩියා සහ නඩත්තුකටයුතු** | | |
| 800,031 | ව්‍යුහ/ගොඩනැගිලි | 2,249,401.56 | |
| 2,227,774 | යන්ත්‍රෝපකරණ, කාර්යාල උපකරණ සහ ලී බඩු | 3,686,932.91 | |
| 4,882,843 | වාහන | 5,081,453.46 | |
| **7,910,648** | | 11,017,787.93 | **11,017,787.93** |

| | | | |
|---|---|---|---|
| - | **ප්‍රවාහණය, සන්නිවේදන, උපයෝගීතා සහ වෙනත් සේවා** | | |
| 3,437,620 | සන්නිවේදනය | 3,651,819.39 | |
| - | ප්‍රවාහණය | 1,336,215.75 | |
| 3,753,920 | රක්ෂණය | 4,881,028.57 | |
| 1,296,304 | ආරක්ෂක සේවා | 1,332,341.13 | |
| 943,398 | පවිත්‍රතා සේවා | 1,228,861.91 | |
| 4,504,142 | විදුලිය සහ ජලය | 6,660,859.57 | |
| 955,431 | වරිපනම් සහ බදු | 960,020.00 | |
| 135,400 | නෛතික ගාස්තු | 886,600.00 | |
| 197,615 | තැපැල් ගාස්තු | 548,647.00 | |
| 500,000 | විගණන ගාස්තු | 80,735.00 | |
| 112,941 | බොල් ණය | - | |
| **15,836,771** | | 21,567,128.32 | **21,567,128.32** |
| **39,250** | බැංකු ගාස්තු | 43,190.00 | **43,190.00** |
| | **ප්‍රදාන, දායක මුදල් සහ සහනාධාර** | | |
| 1,912,069 | සුබ සාධන වියදම් | 2,564,167.50 | |
| **1,912,069** | | 2,564,167.50 | **2,564,167.50** |
| **104,960,899** | **මුළු වියදම්** | **139,325,145.49** | **139,368,335.49** |

# 6. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

## 6.1 සංයුතිය සහ ගණපූර්ණය

විගණන හා කළමණාකරණ කමිටු මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචනයට බඳුන්වන වර්ෂයෙහිදී කමිටුවෙහි සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී.

**2014.01. 21 දින පැවති 2014/01 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.සේමසිංහ මයා - සභාපති/භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස්.වනසිංහ මයා - සාමාජික /අමාත්‍යාංශ නියෝජිත
3. ඇලෙක්ස් නිශාන්ත මයා - සාමාජික
4. එන්.උදයංග මයා - සාමාජික

**2014.04.30 දින පැවති 2014/02 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.සේමසිංහ මයා - සභාපති/භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස්.වනසිංහ මයා - සාමාජික /අමාත්‍යාංශ නියෝජිත
3. ඇලෙක්ස් නිශාන්ත මයා - සාමාජික
4. එන්.උදයංග මයා - සාමාජික

**2014.08.21 දින පැවති 2014/03 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.සේමසිංහ මයා - සභාපති/භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස්.වනසිංහ මයා - සාමාජික /අමාත්‍යාංශ නියෝජිත
3. ඇලෙක්ස් නිශාන්ත මයා - සාමාජික
4. එන්.උදයංග මයා - සාමාජික

**2014.12.04 දින පැවති 2014/04 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.සේමසිංහ මයා - සභාපති/භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස්.වනසිංහ මයා - සාමාජික /අමාත්‍යාංශ නියෝජිත
3. ඇලෙක්ස් නිශාන්ත මයා - සාමාජික
4. එන්.උදයංග මයා - සාමාජික

විගණකාධිපතිවරයාගේ නියෝජිතයකු හා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා රැස්වීම සඳහා සහභාගී වූහ. කමිටුවෙහි කළමනාකරණය නියෝජනය කරන සාමාජිකයින් කිසිවෙකු නොමැත. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආරාධනයෙන් රැස්වීම සඳහා සහභාගී වේ.කළමනාකරණයේ අනෙකුත් සාමාජිකයින්ගේ සහභාගීත්වය කමිටුවට අවශ්‍ය වූ විට රැස්වීම සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලබයි.කමිටුවෙහි ගණපූර්ණය සාමාජිකයින් 03 කි.

## 6.2 කමිටුවෙහි කාර්යය භාරය

- ආකෘති සහ අන්තර්ගතය සමාලෝචනය කිරීම සහ පොල් සංවර්ධන අධිකාරියෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රමයෙහි විශ්වසනීයත්වය අධීක්ෂණයට ලක් කිරීම.
- බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයෙහි විෂය මූලිකත්වය හා සඵලදායකත්වය සහතික කිරීම සඳහා යොදා ඇති ක්‍රියා මාර්ග නියාමනය හා සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලනයන්හි යෝග්‍යතාවය සහ සාර්ථකත්වය සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා,බාහිර විගණන විමසුම් හා ඒ සඳහා ගන්නා ලද පියවර සමාලෝචනය කිරීම.
- නියාමන සහ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සමඟ අනුගත වීම සහ අදාළ නියාමන අධිකාරීන් සමඟ පවත්නා සම්බන්ධා සහතික කිරීම සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිතීන් හා ක්‍රියාපරිපාටීන් පිළිබඳ සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 6.3 රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය හතරවරක් කමිටුව (04) හමුවන ලදී. රැස්වීම සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගී වූ ගණන |
|---|---|
| ආර්.සේමසිංහ මයා | 04 |
| එන්.එස්.වනසිංහ මයා | 04 |
| ඇලෙක්ස් නිශාන්ත මයා | 01 |
| එන්.උදයංග මයා | 03 |
| විගණන අධිකාරී(ආරාධිත) | 04 |

සමාලෝචිත වර්ෂය කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී.

## 6.3.1 අභ්‍යන්තර විගණනය

- 2014 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි සඵලදායකත්වය අධීක්ෂණයට ලක් කරන ලදී.
- අනාගතයේදී නැවත සිදුවීම් වළක්වනු පිණිස කාලීන නිරවද්‍ය පියවරයන් ගැනීමේ අරමුණින් යුතුව විශේෂ අභ්‍යන්තර විගණන සොයා ගැනීම් හා ඒවා සඳහා කළමණාකරණයේ ප්‍රතිචාර සමාලෝචනයට ලක් කරන ලදී.
- 2014 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනයට ලක් කරන ලදී.

## 6.3.2 බාහිර විගණනය

- 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් විගණකාධිපති විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව,කළමනාකරණ ලිපිය,එයට අදාලව කළමනාකරණය විසින් දක්වන ලද ප්‍රතිචාර,සමාලෝචනයට ලක් කරන ලද අතර විශේෂයෙන් පෙන්වාදෙන ලද ගැටළු නැවත ඇති වීම වළක්වනු පිණිස කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කරන ලදී.

## 6.3.3 මූල්‍ය වාර්තාකරණය

- වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණ හා නියාමන අධිකාරිය විසින් නියම කරන ලද අවශ්‍යතාවයන්ට හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවට සහතික කිරීමේදී මණ්ඩලයට සහයවන ලදී.

### 6.3.4 රැස්වීම් වාර්තා/ මණ්ඩලයට වාර්තා කිරීම

- කමිටු පැවැත්වීම පිළිබඳ යෝග්‍ය රැස්වීම් වාර්තා මණ්ඩලීය ලේකම් කාර්යාලයෙහි පවත්වාගෙන යනු ලැබේ.රැස්වීම්වල සියළුම වාර්තා සභාගත කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සම්මත කර ගන්නා ලදුව කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබා ගනු ලැබේ.ක්‍රමික පදනමක් මත කැපී පෙනෙන කරුණු සම්බන්ධයෙන් පසු පියවරයන් ගනුලැබේ.

විගණන හා කළමනාකරණ කමිටුවෙහි අදහස වනුයේ ,ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් සඵලදායි අන්දමින් ක්‍රියාත්මක කරනු ලබන බව හා වත්කම් ප්‍රමාණවත් අන්දමින් ආරක්ෂා කරන බවයි. තවද අධිකාරියෙහි අනුගත රාමුවට සහ යෝග්‍ය අවස්ථාවන්හිදී ගන්නා ලද නිවැරදි කිරීමේ සහ වළක්වාලීමේ පියවරයන් සම්බන්ධයෙන් කමිටුව තෘප්තිමත් වේ.

2014.12.30 දින මෙම වාර්තාව විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලදී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. LP/K/CDA/1/14/02

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2015 අගෝස්තු 14 දින

3 1 AUG 2015

සභාපති

පොල් සංවර්ධන අධිකාරිය

**පොල් සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

පොල් සංවර්ධන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය නිරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පොල් සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වාහන අතුරින් තවදුරටත් භාවිතා කරන වාහන සඳහා ප්‍රත්‍යාගණනයක් කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රූපවාහිනී සංස්ථාවෙන් හා ගුවන් විදුලි සංස්ථාවෙන් පිළිවෙලින් අධිකාරියට අයවිය යුතු රු. 8.796,480 ක් හා රු.136,970 ක් ලැබිය යුතු ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් 2006 වර්ෂයේ දී ගොවිජන සමාගමක් වෙත ලබාදුන් රු.2,000,000 ක ණය මුදල ගිවිසුම් ප්‍රකාරව ණය ප්‍රදානය කළ දින සිට මාස 06 ක් ඇතුළත පොලී රහිතව සමාන වාරික වලින් ගෙවා නිම කළයුතු වුවත්, එයින් තවදුරටත් ලැබිය යුතු රු.1,450,000 ක මුදල ජංගම වත්කමක් වුවත් එම මුදල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) අධිකාරියේ නිලධාරියෙකු අයථා ලෙස පරිහරණය කරන ලද මුදල හා ඊට අදාල පොලිය ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 1,845,676 ක් ගිණුම් වල දක්වා තිබූ අතර විචක්ෂණභාවය පිළිබඳ සංකල්පයට පටහැනිව අයකර ගැනීමේ අවදානමක් පවතින මෙම ණය මුදල සඳහා ලැබිය යුතු පොලිය ද වාර්ෂිකව ගිණුම්ගත කර තිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වත්කම් වැඩියෙන් ප්‍රකාශ කර තිබුණි.

## 2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජය සතු සමාගමකට 1985 වර්ෂයේ දී ලබාදී තිබුණු රු.26,715,037 ක ණය මුදලක් සඳහා වාර්ෂිකව පොලිය ගණනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ගණනය කළ පොලිය රු.28,081,263 ක් විය. කෙසේ වුවද මෙම පොලී මුදල සම්පූර්ණයෙන්ම අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණි. එම ආයතනයටම පොලී රහිත ණය වශයෙන් රු.මිලියන 31.55 ක මුදලක් 2002 හා 2004 වර්ෂවලදී ලබා දී තිබුණු අතර මෙම මුදල් ද අධිකාරියට අය නොවී පැවතුණි.

(ආ) දිසිදි පොල් මෝල් හිමියන්ගෙන් අයවිය යුතු ගාස්තු හා නැවුම් පොල් හා කොප්පරා වෙන්දේසි කටයුතු වෙනුවෙන් අය විය යුතු බිම් කුලිය රු.1,801,696 ක මුදලක් 2015 ජූනි 30 දින දක්වාම අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.15,457,175 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 36,419,413 ක් වීමෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,962,238 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. රජයේ ප්‍රදාන ඇතුළු මුළු ආදායම රු. 57,605,867 කින් වැඩි වී තිබුණද ඊට සාපේක්ෂව පර්යේෂණ හා සංවර්ධන, පුහුණු ඇතුළු අනෙකුත් වියදම් රු. 75,531,318 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. අධිකාරියේ මුළු ආදායමෙන් සියයට 71 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින්ද, සියයට 13 ක් මෙහෙයුම් ආදායමෙන්ද, සියයට 16 ක් විවිධ ආදායම් වලින්ද සමන්විත වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ජාත්‍යන්තරයට ඉදිරිපත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රුසියාවේ මොස්කව් හා ජර්මනියේ එසෙන්හිදී පවත්වන ලද වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වීමට නිෂ්පාදන / අපනයනකරුවන් තෝරාගැනීමේදී ක්‍රමවත් ලකුණු දීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණු අතර අපනයනකරුවන් අධිකාරිය හා එළඹ සිටි ගිවිසුම්වල අධිකාරිය පාර්ශවයෙන් බලයලත් නැනැත්තෙකු අත්සන් තබා නොතිබුණි. එසේම ඔවුන් ඉදිරිපත් කර තිබුණු මුලා බැඳුම්කර නිදහස් කර තිබුණද සලකා බැලිය යුතු කරුණු පිළිබඳ අවධානය යොමුකළ බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර, රුසියාවේ මොස්කව් වෙළඳ ප්‍රදර්ශනයේ ප්‍රගතිය ද සමාලෝචනය කර නොතිබුණි.

(ආ) අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඒකාබද්ධව දිසිදි නිෂ්පාදන පොල් මෝල් 45 කට . ආහාර සුරක්ෂිත කළමනාකරණ පද්ධති සඳහා උපද්‍රව විශ්ලේෂණ සහ අති අවධානම් ලක්ෂ පාලන (HACCP) තත්ත්ව සහතිකකරණය හඳුන්වා දීමේ කාර්යය වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේදී තෝරාගෙන තිබුණි. අධිකාරිය එම ආයතනය සමඟ මුළු වටිනාකම වූ රු. 4,050,000 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර එයින් සියයට 20 ක් වන මූලික අත්තිකාරම් මුදල වූ රු. 810,000 ක් පළමු අදියර ලෙස එම මාසයේදීම ගෙවා තිබුණි. ගිවිසුම අනුව දෙවන අදියරේදී දිසිදිමෝල් 45 ක් සඳහා සහතිකකරණයට අවශ්‍ය කරන ලියවිලි ඉදිරිපත් කිරීම 2015 ජනවාරි 31 දින අවසන් කළ යුතුව තිබුණද 2015 ජූනි දක්වාම මෙම කාර්යය අවසන් කර නොතිබුණි.

(ඇ) පොල් නිෂ්පාදනවල තත්ත්වය හා ගුණාත්මක බව යහපත්ව පවත්වා ගනිමින් ජාත්‍යන්තර වෙළඳපලට සන්නාම නාමයක් යටතේ ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදන ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සන්නාම නාමයක් ලබා ගැනීමට අදාල ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ක්‍රමවේදය සකස් කිරීම වෙනුවෙන් රු. 350,000 ක් උපදේශකවරයෙකුට ගෙවා තිබූ අතර එම සන්නාම නාමය ලබා ගැනීමට අදාල මුළු ක්‍රියාවලියම සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීමකින් තොරව ගිවිසුමකට එළඹීම නිසා මෙම සන්නාම නාමය ලබා ගැනීම 2015 ජූනි 15 දින දක්වාම ඉටු වී නොතිබුණි. තවද මෙම සන්නාම නාමය ලබා ගැනීමේ ක්‍රියාවලියේදී අවශ්‍ය වූ ලාංඡනයක් නිර්මාණය කිරීම සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව රු. 135,000 ක් බාහිර පුද්ගලයෙකුට ගෙවා තිබුණි.

(ඇ) පොල් වගා බිම් ප්‍රමාණය හා පොල්ගස් සංඛ්‍යාව Geographic Information System තාක්ෂණය මගින් ගණනය කිරීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය සමඟ අධිකාරිය 2014 ජුනි 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව මුළු වියදම් ඇස්තමේන්තුව රු. 2,587,500 ක් වූ අතර එයින් සියයට 20 ක් එනම් රු. 517,500 ක් 2014 දෙසැම්බර් 15 දින කොළඹ විශ්ව විද්‍යාලයට ගෙවා තිබුණි. 2015 පෙබරවාරි 05 වන විට එම කාර්යය අවසන් කළයුතුව තිබුණ ද ගණනය කිරීම්වල ප්‍රතිඵල ඇතුලත් වාර්තාවක් 2015 මැයි 31 දින දක්වාම ලැබී නොතිබුණි.

(ඉ) ගෘහස්ථ පරිභෝජනයේදී සිදුවන පොල් නාස්තිය අවම කිරීමෙන් පොල් අපනයන ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ගෙඩි පොල් වෙනුවට පොල් කිරි , පොල් කිරි පිටි හා පොල් ක්‍රීම් ප්‍රචලිත කිරීම සඳහා අධිකාරිය ප්‍රචාරණ ආයතන ලෙස ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව තෝරාගෙන තිබුණි. 2014 අගෝස්තු 14 සිට 2015 අප්‍රේල් 13 දක්වා කාලය සඳහා ප්‍රචාරණ ගාස්තු වශයෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට රු.9,344,832 ක්ද, 2014 සැප්තැම්බර් 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා ප්‍රචාරණ ගාස්තු වශයෙන් රු.3,936,228 ක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවටද අධිකාරිය ගෙවා තිබුණි. එයින් රූපවාහිනී සංස්ථාව හා ගුවන් විදුලි සංස්ථාව පිළිවෙලින් රු. 8,796,480 ක් හා රු. 136,970 ක් ඉතිරිව ඇති බව අධිකාරියට දන්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ රූපවාහිනී සංස්ථා මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරියට ආපසු ගෙවිය යුතු මුදලක් නොමැති බවත් ගුවන් විදුලි සංස්ථාවෙන් අධිකාරියට ලැබිය යුතු මුදල රු. 1,269,922 ක් බවත් සනාථ විය. තවද රූපවාහිනී සංස්ථාව හා ගුවන් විදුලි සංස්ථාව විසින් ප්‍රචාරණ කටයුතු සිදුකළ බව තහවුරු කරගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු අධිකාරිය විසින් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

### 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

2014 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 259 ක්ද තථ්‍ය සංඛ්‍යාව 178 ක්ද වීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාල වන තනතුරු 81 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවතුණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අරමුදල් උපයෝජනය
(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඇ) මෙහෙයුම් පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)